1. ආර්ථික ක්‍රියාකාරිත්වය, ගැටළු සහ ප්‍රතිපත්ති

1.1 සමස්ත නිරීක්ෂණ

දුෂ්කර තත්ත්වයන්ට සාර්ථකව මුහුණ දීමට සැලකිය යුතු හැකියාවක් ඇති බව පෙන්වමින් ශ්‍රී ලංකා ආර්ථිකය 1996 දී සියයට 3.8 කින් වර්ධනය විය. 1987 න් පසුව ඇති වූ දීර්ඝතම නියගය, කෘෂිකාර්මික වර්ධනය සියයට 4.6 කින් පහත හෙළීය. තාප බල ධාරිතාවය ඉහළ නැංවීමට ගත් ප්‍රයත්නයන් මධ්‍යයයේ ද මෙම නියගය ජල විදුලිබල සැපයුම කෙරෙහි අහිතකර ලෙස බලපෑවේ ය. ගැටළු තවත් සංකීර්ණ බවට පත්කළ, නගරයන්හි ඇති වූ ත්‍රස්තවාදී සිද්ධීන් කිහිපය, ව්‍යාපාරික විශ්වාසය කෙරෙහි බලපෑ බව පෙනේ. එසේ තිබියදීත්, කර්මාන්ත අංශය සතුටුදායක වර්ධනයක් පෙන්නුම් කළේය. මූල්‍ය, සංනිවේදන සහ ප්‍රවාහන යන අංශයන්හි වර්ධනයන් ද එසේ සතුටුදායක විය. වර්ෂය අවසානය වන විට ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමේ පැහැදිලි සලකුණු දිස්වීම දිරිගන්වන සුළු කරුණක් විය.

පවතින මිල දර්ශකයන් අනුව පාරිභෝගික මිල ගණන්, නියගය හේතුවෙන් ඇති වූ ආහාර ද්‍රව්‍ය හිඟයන් සහ ලෝක වෙළෙඳ පොළ මිල ගණන් වැඩිවීම් ප්‍රධාන වශයෙන් පිළිබිඹු කරමින් සියයට 14-16 කින් වැඩි වූ අතර, දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය දැක් වූ පරිදි සමස්ත මිල මට්ටම සියයට 12 ක වැඩිවීමක් පෙන්වන ලදි. 1995 වර්ෂයේ සිට දක්නට ලැබුණු අධි ද්‍රවශීලතාවයට අමතරව, රජයට මෙන්ම පෞද්ගලික අංශයට දුන් ණයවල ඉහළ වර්ධනය හේතුවෙන් 1996 වර්ෂයේ ප්‍රථම භාගයේ දී මුදල් ප්‍රසාරණය ඉහළ මට්ටමක පැවතුණි. එසේ වුව ද, පෞද්ගලික අංශයේ ණය වර්ධනය අඩුවීම සහ දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම හේතුවෙන්, වර්ෂය අවසන් වනවිට, සියයට 11 ක් දක්වා සැලකිය යුතු ලෙස මුදල් වර්ධනය අඩුවිය. ආරක්ෂක වියදම් සහ සභනාධාර වියදම් වැඩි වී, පෞද්ගලිකරණ අරමුදල් ලැබීම් අඩු වුව ද, සමස්ත අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.8 කට සීමාවිය.

සංඛ්‍යා සටහන 1.1
තෝරාගත් සාර්ව ආර්ථික දර්ශක

	1995 (අ)	1996 (අ)	1987-91 සාමාන්‍ය	1992-96 සාමාන්‍ය (අ)	1995 (අ)	1996 (අ)
	රුපියල් දශලක්ෂ		ප්‍රතිශත වෙනස			
පවත්නා සාධක වියදම් මිල අනුව ද. දේ. නි.	598,327	695,934	15.7	15.6	14.3	16.3
ස්ථාවර (1982) සාධක වියදම් මිල අනුව ද. දේ. නි.	167,953	174,261	3.5	5.2	5.5	3.8
පවත්නා සාධක වියදම් මිල අනුව ද. ජා. නි.	165,897	171,056	3.5	5.3	6.0	3.1
ඒක පුද්ගල (මූර්ත) ද. දේ. නි.	9,273	9,515	2.1	3.9	4.0	2.6
			ද. දේ. නි. යේ ප්‍රතිශතයක් වශයෙන්			
දළ දේශීය ආයෝජන	171,825	186,264	22.6	25.4	25.7	24.2
රජය	23,645	25,618	5.1	3.5	3.4	3.3
පෞද්ගලික	148,180	160,646	17.5	21.9	22.2	20.9
දළ දේශීය ඉතුරුම්	102,111	119,260	12.8	15.4	15.3	15.5
විදේශීය ඉතුරුම්	69,714	67,004	9.8	10.0	10.4	8.7
විදේශීය සෘජු ආයෝජන ගලාඒම් (ශුද්ධ)	2,931	6,606	0.6	1.1	0.4	0.9
නිල ණය සහ ප්‍රදාන (ශුද්ධ)	32,106	20,989	6.7	4.0	4.8	2.7
වෙනත් (ආ)	34,677	39,409	2.5	4.9	5.2	5.1
ජාතික ඉතුරුම්	129,973	147,552	15.2	19.2	19.5	19.2
ඉන් ශුද්ධ විදේශීය ආයෝජන ආදායම	-6,958	-11,154	-2.2	-1.4	-1.0	-1.5
ප්‍රේෂණ (ශුද්ධ)	34,820	39,485	4.6	5.2	5.2	5.1
ද. දේ. නි. අවධමනකය (1982=100) (ඇ)	356	399	11.8	9.9	8.4	12.1
ජනගහනය ('000) (ඇ)	18,112	18,315	1.4	1.2	1.4	1.1

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) ශුද්ධ පෞද්ගලික මැදිකාලීන සහ දිගුකාලීන ණය සහ සියළුම ශුද්ධ කෙටිකාලීන ප්‍රාග්ධනය සහ ශුද්ධ විදේශ වත්කම්වල වෙනස්වීම ඇතුලත් ය
(ඇ) අවසාන සංඛ්‍යා හතර ප්‍රතිශත වෙනස්වීම් වේ

වර්ෂයේ ප්‍රථම භාගයේදී අඩු වේගයකින් වර්ධනය වූ ආනයන සහ අපනයන, වර්ෂයේ දෙවන භාගයේ දී වේගවත් වර්ධනයක් දැක්විය. මුළු වර්ෂය ගත්කල, අපනයන හා ආනයන පිළිවෙලින් සියයට 13 කින් හා සියයට 7 කින් වැඩි වී, වෙළෙඳ ගිණුමේ හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත්විට සියයට 9.5 දක්වා අඩුවිය. මූර්ත අපනයන සියයට 4 කින් පමණක් ඉහළ ගිය අතර, මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ තේ මිල ගණන් වැඩිවීමය. 1996 දී ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ හිඟය, ප්‍රතිශතාංක 1 කින් පහත වැටී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3.9 ක් විය. එසේ වුව ද, සමස්ත ගෙවුම් තුලනය ප්‍රධාන වශයෙන් නිල ප්‍රාග්ධන ගලාප්ම් අඩුවීම හේතුවෙන් විගැහි දශ ලක්ෂ 63 ක හිඟයක් වාර්තා කළේය. වර්ෂය අවසාන භාගයේ දී පෞද්ගලික විදේශීය ආයෝජන සැලකිය යුතු ලෙස වැඩි වුව ද, පසුගිය වර්ෂවල ගලාප්ම් හා සංසන්දනය කරන විට සාපේක්ෂව අඩු ප්‍රමාණයකි

ඉහළ දේශීය උද්ධමනය සහ ගෙවුම් තුලනය දුර්වල වීම පිළිබිඹු කරමින්, ශ්‍රී ලංකා රුපියල සියයට 5 කින් අවප්‍රමාණය විය. වැඩි දියුණුවූ ආර්ථික කළමනාකරණය, ප්‍රධාන වශයෙන් හේතුකොට ගෙන, විදේශ විනිමය හා මූල්‍ය වෙළෙඳපොළවල් 1996 වර්ෂයේ දී බොහෝ දුරට ස්ථාවර විය.

මැදිකාලීන රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධතා රාමුවක් තුළ, පෞද්ගලික අංශය ප්‍රමුඛ කරගත් උද්ධමනකාරී නොවන වර්ධනයක් ඇති කිරීමට ඇති තම බැඳීම, රජය විසින් 1997 අයවැය ඉදිරිපත් කිරීම සමග නැවතත් තහවුරු කරන ලදී. නොකඩවා පවතින රාජ්‍ය මූල්‍ය හිඟය, බොහෝ දුරට ව්‍යුහාත්මක ස්වරූපයක් ගන්නා බැවින්, අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයන් කිරීමට පියවර ගන්නා ලදී. මෙම ප්‍රතිසංස්කරණ වල අරමුණ වූයේ රාජ්‍ය අංශය ප්‍රතිසංස්කරණය කිරීම, බදු පදනම පුළුල් කිරීම, රාජ්‍ය ණය අඩු කිරීම, මූල්‍ය අංශය හැඩ ගැස්වීම සහ ශ්‍රම වෙළෙඳපොල විවෘත කිරීමය. මෙහි සමස්ත අරමුණ වූයේ ඉතා පීඩාවට පත් ජන කොටස්වල සුභසාධනය ආරක්ෂා කරන අතර, රජයේ කටයුතු අඩුකර පෞද්ගලික අංශය වෙත පූර්ණ දිරිගැන්වීමක් ලබාදීමය. රැකියා වියුක්තියේ ක්‍රමික අඩුවීමත් දිළිඳුකම අඩු කිරීමත් සමග උද්ධමනකාරී නොවන තිරසාර වර්ධනයක් ලබා ගැනිමට උපකාරී වන තත්ත්වයන් ඇති කිරීමට මෙම ප්‍රතිසංස්කරණ අවශ්‍ය බව හැඟුණි. මෙම ප්‍රතිපත්තිවල සාර්ථකත්වය, බොහෝදුරට වියදම්කාරී උතුරු නැගෙනහිර අර්බුදය සමතයකට පත්කිරීමෙහි ලා ඇතිකර ගනු ලබන ප්‍රගතිය මත රඳා පවතින බව පැවැසීම අවශ්‍ය නොවේ.

මෙම තත්ත්වය යටතේ, ස්ථායිකරණ අරමුණුද රැකගෙන ආර්ථික වර්ධන වේගය නැවත වැඩිකර ගැනිමේ ක්‍රියාවලිය, මූල්‍යනය සඳහා ප්‍රමාණවත් මූල්‍ය සම්පත් ලබාදීම සහතික කරනු වස් මහ බැංකුව මූල්‍ය ප්‍රතිපත්තියෙහි යම් ලිහිල් කිරීමක් ඇති කිරීමට ඇති හැකියාව සලකා බලන ලදි

1.2 මූර්ත අංශයේ වර්ධනයන්

ආර්ථික වර්ධනය

1996 ආර්ථික ක්‍රියාකාරිත්වය, ශ්‍රී ලංකා ආර්ථිකය දුෂ්කරතාවයන් යටතේ යථා තත්ත්වයට පැමිණීම ට ඇති හැකියාව පිළිබිඹු කරන ලදී. නියගය හා විදුලි බලය කපා හැරීම නිසා 1996 වර්ෂයේ ප්‍රථම භාගයේ දී පසුබෑමකට ලක් වූ කෘෂිකාර්මික හා කාර්මික කටයුතු නැවත යථා තත්ත්වයට පත්වීම හේතුකොට ගෙන දළ දේශීය නිෂ්පාදිතය මූර්ත වශයෙන් සියයට 3.8 කින් වර්ධනය විය. වර්ෂයේ අවසාන භාගයේ දී ආර්ථිකය එහි වර්ධන වේගය සැළකිය යුතු ලෙස නැවත ලගා කර ගන්නා ලදී. ආර්ථික ප්‍රතිපත්ති වඩ වඩාත් ලිහිල් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පසුගිය දශක කිහිපය තුළ දී රටේ ආර්ථික ව්‍යුහය සැලකිය යුතු ලෙස විවිධාංගීකරණයට භාජනය වී ඇත කෙසේ වුව ද, විදුලිබල උත්පාදනය සඳහා ජල විදුලිය බලය මත ඇති දැඩි රැඳියාව හේතුවෙන් මෑත දී ඇති වූ නියගය වැනි ස්වාභාවික උපද්‍රවයන්වලට දේශීය ආර්ථිකය පීඩාවට පත් කිරීමේ හැකියාව ඉහළ මට්ටමක පැවතුණි. සීග්‍ර ආර්ථික වර්ධනයක් ලබා ඇති නැගෙනහිර ආසියානු රටවල් මෙන් ඉහළ ආර්ථික වර්ධන වේගයක් ලගා කර ගැනීම සඳහා රටේ මූලික ආර්ථික යටිතල පහසුකම් කඩිනම්ව වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය, 1996 විදුලි බලය කපා හැරීම තුළින් පැහැදිලිව පෙන්නුම් කරන ලදී. මෙවැනි දුර්වලතා

රූප සටහන 1.1
ආදායම් වර්ධනය

රූප සටහන 1.1.1
වාර්ෂික වර්ධනය අනුපාතිකයන්



රූප සටහන 1.1.2
කාලච්ඡේදය සාමාන්‍ය වර්ධන අනුපාතිකයන්



පැවැතිය ද, කඩිනම්ව අවශ්‍ය වූ ප්‍රාග්ධන භාණ්ඩ සහ ආහාර ද්‍රව්‍යයන් ප්‍රමාදයකින් තොරව ආනයනය කිරීමට ඉඩ සැලසූ රටෙහි පවතින විවෘත වෙළඳ හා ගෙවීම් ප්‍රතිපත්ති සමුදාය මගින් නිෂ්පාදන පාඩුව අවම කිරීමටත්, මිළ ගණන්වල තියුණු ඉහළයාම් මග හැරවීමටත්, හැකිවීමෙන් ආර්ථිකය යථා තත්ත්වයට පත්කිරීමේ ක්‍රියාවලිය පහසු කරන ලදි

වෙළෙඳපොල මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය සියයට 15.1 න් වැඩි

සංඛ්‍යා සටහන 1.2
ස්ථාවර (1982) සාධක වියදම් මිල යටතේ දළ ජාතික නිෂ්පාදිතය (වාර්ෂික ප්‍රතිශත වෙනස)

	1987-91	1992-96	1987	1995	1996
1. කෘෂිකර්මය, දැව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය	1.1	1.1	-5.8	3.3	-4.6
කෘෂිකර්මය	0.9	0.9	-8.1	3.3	-5.1
තේ	2.9	3.0	1.0	1.6	-5.1
රබර්	-5.1	2.4	-10.6	0.9	6.3
පොල්	4.7	3.5	-24.6	5.1	-7.6
වී	-0.6	1.9	-18.0	4.7	-26.7
අනෙකුත්	4.2	1.7	1.7	2.6	3.5
දැව ආදී වන ද්‍රව්‍ය	1.8	0.9	13.1	1.2	1.3
ධීවර කර්මාන්තය	3.8	2.7	3.8	4.9	-3.9
2. පතල් හා කැනීම් කටයුතු	6.5	4.8	19.0	3.4	8.9
3. නිමැවුම් කර්මාන්ත	6.4	8.8	6.8	9.2	6.5
4. ඉදිකිරීම්	2.0	5.8	1.8	4.9	3.4
5. විදුලිය, ගෑස් සහ ජලය	5.1	7.1	3.0	10.2	-2.0
6. ප්‍රවාහනය, ගබඩා කිරීම සහ සංනිවේදනය	3.1	5.4	1.2	5.5	7.5
7. තොග සහ සිල්ලර වෙළෙඳාම	3.7	5.8	2.8	3.6	5.2
8. බැංකු, රක්ෂණ හා නිශ්චල දේපල	5.7	9.4	6.1	10.5	10.1
9. නිවාස අයිතිය	1.5	1.2	1.5	1.3	1.3
10. රාජ්‍ය පරිපාලන සහ ආරක්ෂක කටයුතු	3.7	3.8	3.1	5.4	5.0
11. සේවා (අන් තැනක සඳහන් නොවන)	4.8	3.9	2.7	4.5	4.0
12. දළ දේශීය නිෂ්පාදිතය	3.4	5.2	1.5	5.5	3.8
13. විදේශීය ශුද්ධ සාධක ආදායම	2.2	6.1	-3.0	23.8	-55.9
14. දළ ජාතික නිෂ්පාදිතය	3.5	5.3	1.6	6.0	3.1

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

වී රුපියල් දශලක්ෂ 768,934 දක්වා වර්ධනය විය. මැදි වසර ජනගහනය වූ දශලක්ෂ 18.315 හා සලකා බලන කළ, 1996 වර්ෂයේ නාමික ඒක පුද්ගල ආදායම රු. 41,984 ක් (ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 760) විය. විදේශ ශුද්ධ සාධක ආදායම් සමග ගැලපූ කල, ඒක පුද්ගල ජාතික නිෂ්පාදිතය එක්සත් ජනපද ඩොලර් 753 ක් වුණි. ලෝක බැංකුවේ, 1996 ලෝක සංවර්ධන වාර්තාව අනුව යම් රටක් මධ්‍යම ප්‍රමාණයේ ආදායම් ලබන සංවර්ධනය වෙමින් පවත්නා රටක් වශයෙන් සැලකීම සඳහා 1994 වර්ෂයේ දී තිබිය යුතු වූ ඒක පුද්ගල ආදායම් මට්ටම වූයේ එක්සත් ජනපද ඩොලර් 725 කි. ඒක පුද්ගල ආදායම අනුව ශ්‍රී ලංකාව නුදුරු අනාගතයේ දී, මධ්‍යම ප්‍රමාණයේ ආදායම් ලබන සංවර්ධනය වෙමින් පවත්නා රටක් වීමට ලබාගත යුතු අවම ආදායම් මට්ටමට ලගා වී ඇත. වැඩිවෙන ඒක පුද්ගල ආදායම සහ බහු ජාතික ආයතන විසින් ලබාදෙන ඉතාමත් සහනදායී ආධාරවල පහත වැටීමේ ප්‍රවණතාවයන් තුළින් පෙන්නුම් කරනුයේ එවැනි සහනදායී මූල්‍ය පහසුකම් ලබා ගැනීමට යොමු වීම ක්‍රමානුකූලව අඩු කිරීමට සූදානම් විය යුතු බවයි. එනම් ශ්‍රී ලංකාවට අනාගත ආයෝජන සඳහා අවශ්‍ය මුදල්, සෘජු විදේශ ආයෝජන සහ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපලෙහි ඇති මධ්‍යම හා දිගුකාලීන අරමුදල් වැනි විකල්ප මාර්ග තුළින් ලබා ගැනීමට බෙහෝදුරට සිදුවනු ඇත.

ශුද්ධ ආයෝජන ගලායාම (ලාභ, ලාභාංශ හා ශුද්ධ පොලී ගෙවීම්වල එකතුව) අධික වූ හෙයින්, 1996 වර්ෂයේ දී මූර්ත දළ ජාතික නිෂ්පාදිතය සියයට 3.1 කින් වර්ධනය විය. මෙය සියයට 1.1 ක් වූ ජනගහන වර්ධනය සමග ගැලපූ කල ඒක පුද්ගල මූර්ත ආදායම 1996 වර්ෂයේ දී සියයට 2 කින් වැඩි වූ අතර පසුගිය වර්ෂයේ මෙය සියයට 4.5 ක් විය.

1995 වර්ෂයේ දී මෙන් 1996 වර්ෂයේ දී ද මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට ඉහළම දායකත්වය ලබා දී ඇත්තේ කාර්මික අංශයයි. මෙම අංශය, 1996 වර්ෂයේ දී ආර්ථික වර්ධනයෙන් සියයට 36 කට දායකවූ අතර, 1995 වර්ෂයේ දී එය සියයට 33 ක් විය. ප්‍රවාහන හා සන්නිවේදන සේවා (සියයට 22) සහ මූල්‍ය සේවා (සියයට 16) යන අංශවල වර්ධනයන් පිළිබිඹු කරමින්, 1995 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයෙන් සියයට 17කට දායක වූ උපයෝගිතා සේවාවන් ඇතුළත් සේවා අංශය 1996 වර්ෂයේ දී සියයට 77 කට දායක විය. 1996 වර්ෂයේ දී, කැනීම් සහ ඉදිකිරීම් අංශ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට සියයට 6 බැගින් දායකවිය. කැනීම් අංශය පසුගිය වර්ෂය හා සසඳා බලන කළ ඉතා ඉහළ දායකත්වයක් ලබා දී ඇත. දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය සියයට 2.5 ක සෘණ අගයක් විය.

රූප සටහන 1.2

ද.ජා.නි ආංශික සංයුතිය



1971-77 කාලය තුළ දී කෘෂිකාර්මික අංශයට (සියයට 1.4) සමාන වාර්ෂික සාමාන්‍ය අනුපාතිකයකින් වර්ධනය වූ (සියයට 1.3) කාර්මික අංශයේ වර්ධනය ක්‍රම ක්‍රමයෙන් කෘෂිකාර්මික අංශය අභිබවා යමින් රටේ ප්‍රධානතම අංශය බවට පත් වුණි. 1992 වර්ෂයේ සිට 1996 දක්වා වූ පස් අවුරුදු කාලය තුළ දී කාර්මික අංශයේ නිෂ්පාදනය සියයට 8.8 කින් වර්ධනය වී ඇති අතර කෘෂිකාර්මික නිෂ්පාදනය වර්ධනය වූයේ සියයට 1.1 කින් ය.

කෘෂිකර්මය

නියගයෙන් විශාල වශයෙන්ම පීඩාවට පත් වූයේ කෘෂිකාර්මික අංශයයි. ඒ හේතුවෙන්, 1991 - 95 කාලසීමාව තුළ පැවැති 2.4 ක වාර්ෂික සාමාන්‍ය වර්ධන අනුපාතය සමග සසඳන කල, 1996 වර්ෂයේ දී මූර්ත එකතු කළ වටිනාකම සියයට 4.6 කින් පහත වැටුණි. 1987 වර්ෂයෙන් පසුව, කෘෂිකාර්මික අංශයේ ඇති වූ අඩුම වර්ධනය මෙය විය. 1987 වර්ෂයේ කෘෂිකාර්මික අංශයට, නියගයෙන් මේ හා සමානම හානියක් ඇති විය. එම වර්ෂයේ කෘෂිකාර්මික නිමැවුම සියයට 5.8 කින් පහත වැටුණ අතර එමගින් සමස්ත ආර්ථික වර්ධනය සියයට 1.5 දක්වා අඩුවිය.

1996 වර්ෂයේ දී, දේශීය කෘෂිකාර්මික නිමැවුම් හා වැවිලි අංශයේ

සංඛ්‍යා සටහන 1.3

දළ දේශීය නිෂ්පාදිතය (ද. දේ. නි. යේ ප්‍රතිශතයක් වශයෙන් ආංශික සංයුතිය) (අ)

	1978	1987	1996
1. කෘෂිකර්මය, වන හා ධීවර කර්මාන්තය	28.7	23.6	18.1
2. පතල් හා කැනීම් කටයුතු	2.5	2.7	2.5
3. නිමැවුම් කර්මාන්ත	15.3	16.2	21.0
4. ඉදිකිරීම්	8.3	7.2	6.9
5. සේවා	45.3	50.3	51.2
විදුලි බලය, ගෑස් සහ ජලය	0.9	1.2	1.4
ප්‍රවාහන, ගබඩා කිරීම සහ සංනිවේදනය	11.0	11.7	11.6
තොග සහ සිල්ලර වෙළෙඳාම	19.3	21.1	21.7
බැංකු, රක්ෂණ සහ නිශ්චල දේපල	3.0	4.7	6.1
නිවාස අයිතිය	3.5	3.1	2.3
රාජ්‍ය පරිපාලනය සහ ආරක්ෂක කටයුතු	3.0	4.7	4.5
සේවා (අන් තැනක සඳහන් නොවන)	4.6	3.8	3.7
6. දළ දේශීය නිෂ්පාදිතය	100.0	100.0	100.0
7. විදේශීය ශුද්ධ සාධක ආදායම	-0.4	-2.3	-1.8
8. දළ ජාතික නිෂ්පාදිතය	99.6	97.7	98.2

අ) 1982 පදනම අනුව

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

[illegible] වගාව ප්‍රධාන වශයෙන් නියගයේ බලපෑමට ගොදුරු විය. 1995 වර්ෂයේ වාර්තාගත නිෂ්පාදනයෙන් පසුව, තේ නිෂ්පාදනය තවදුරටත් සියයට 5 කින් වැඩි වූ අතර, කොළඹ වෙන්දේසියේ තේ මිල ගණන් සියයට 44 කින් වැඩි වී [illegible] මට්ටමකට ළඟාවිය. මෙසේ නිමැවුම් වැඩිවීමට, ආකර්ශණීය මිල ගණන්, කුඩා තේ වතු හිමියන්ගේ වැඩි වූ ඵලදාව හා පෞද්ගලික කළමනාකරණය යටතේ වූ සමහර වතුවල වැඩි වූ කාර්යක්ෂමතාවය යන කරුණු දායක විය. රබර් නිෂ්පාදනයේ සියයට 6 ක වැඩි වීමක් වාර්තා වූ අතර මිල ගණන්ද ආකර්ශණීය තත්ත්වයෙන්ම පැවතිණි. පොල් නිෂ්පාදනය සියයට 7.6 කින් පහත වැටුණි.

නියගයෙන් මහත් පාඩු පැමිණි වී වගා අංශයේ නිමැවුමේ සියයට 27 ක පහත වැටීමක් වාර්තා කළ අතර මිල ගණන් සියයට 31 කින් වැඩිවුණි. සෑම වී වගා කරන දිස්ත්‍රික්කයකම පාහේ වගා හානි අත්දකින ලදී. කුරුණෑගල, අනුරාධපුරය සහ පොළොන්නරුව දැඩි බලපෑමට ගොදුරු වූ දිස්ත්‍රික්ක විය. පසුගිය වර්ෂයේ නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ගොවීන්ට ලබා දුන් රුපියල් දශ ලක්ෂ 792 ක ණය ප්‍රමාණය, වගා කරන ලද බිම් ප්‍රමාණයේ තිබුණු අඩුවීමත් සමග 1996 වර්ෂයේ දී රුපියල් දශ ලක්ෂ 396 ක් දක්වා අඩුවිය. බුසලකට රුපියල් 155 ක් (කිලෝ ග්‍රෑමයකට රුපියල් 7.42) වූ සහතික මිලට වඩා විවෘත වෙළෙඳ පොළෙහි වී මිල ඉහළ මට්ටමක පැවතුණි. පසුගිය වර්ෂයේ වී අලෙවි මණ්ඩලය මගින් මිල දී ගත් වී ප්‍රමාණය වූ මෙට්‍රික් ටොන් 282,000 සමග සසඳා බලන කල, විමසුමට ලක් කරන වර්ෂය තුළ දී මෙට්‍රික් ටොන් 1000 ක් පමණක් මිල දී ගැනීමට හැකිවීමෙන් පෙනී ගියේ එම මණ්ඩලය අක්‍රිය යයි කිවහැකි තත්ත්වයකට පත් වී ඇති බවයි. 1996 දී සහල් මෙට්‍රික් ටොන් 341,000 ක් ආනයනය කිරීමට සිදුවූ අතර මෙය 1977 ට පසු ආනයනය කරනු ලැබූ ඉහළම ප්‍රමාණය වේ. පරිභෝගිකයාට සහනයක් සැලසීමේ අරමුණෙන්, හා ආනයනය දිරි ගැන්වීමේ අරමුණින් සහල් සඳහා වූ තීරු බදු ගාස්තු 1996 අප්‍රේල් මාසයේ සිට අත් හරින ලදී.

අනෙකුත් ක්ෂේත්‍ර බෝග අංශයේ මිශ්‍ර ක්‍රියාකාරීත්වයන් දක්නට ලැබිය. අර්තාපල්, කව්පි හා මුං ඇට වැනි සමහර බෝග වර්ග ඉහළ නිෂ්පාදන මට්ටම් පෙන්නුම් කළ අතර සමහරක නිෂ්පාදන අඩුවිය. සීනි නිෂ්පාදනය සියයට 3 කින් වැඩි විය. සත්ව පාලනය ඇතුළුව අනෙකුත් කෘෂිකාර්මික බෝගයන්හි එකතු කළ වටිනාකම, ප්‍රධාන වශයෙන් එළවළු සහ සුළු අපනයන බෝග නිමැවුමෙහි වැඩිවීමක් පිළිබිඹු කරමින් සියයට 3.5කින් වර්ධනය විය. ජල පිවි මත්ස්‍ය නිෂ්පාදනයේ වැඩිවීමක් සිදු වුව ද මුහුදු ධීවර අංශයේ මත්ස්‍ය නිෂ්පාදනය අඩුවීම හේතුවෙන් මුළු මත්ස්‍ය නිෂ්පාදන සියයට 4 කින් අඩුවිය.

පතල් සහ කැනීම්

පතල් සහ කැණීම් අංශයේ මූර්ත එකතු කළ අගයෙහි වැඩිවීම සංසන්දනාත්මකව බලන කල 1995 දී සියයට 3.4 සිට 1996 දී සියයට 8.9 දක්වා ඉහළ නැගුණි. මේ අංශය තුළ විශාල කොටසකට දායක වන මැණික් පතල් කටයුතු, වර්ෂය තුළ දී ඉතා හොඳින් ක්‍රියාකාරී විය. මැණික් අපනයනය විගැහි වටිනාකම අනුව සියයට 16 කින් වැඩිවිය. ග්‍රැපයිට් හා ඛණිජ වැලි අංශයන් ද කැපී පෙනෙන වර්ධනයක් පෙන්වා ඇත.

නිෂ්පාදන කර්මාන්ත

නිෂ්පාදන කර්මාන්ත අංශය තුළ කම්හල් නිමැවුම්, වඩාත් ක්‍රියාශීලි උප අංශය වූ අතර කුඩා කර්මාන්ත අංශය ඊළඟට ඉහළ වර්ධනයන් වාර්තා කළ උප අංශය විය. 1996 න් අවසන් වන පසුගිය වසර පහ තුළ කම්හල් නිමැවුම් වාර්ෂිකව සියයට 10 කින් පමණ වර්ධනය වූ අතර කුඩා කර්මාන්ත නිමවුම සියයට 6 කින් පමණ වැඩිවිය. වැවිලි බෝග සැකසීම ආශ්‍රිතව ව්‍යාප්ත වූ කර්මාන්ත උප අංශය ප්‍රධාන බෝග තුනෙහි නිෂ්පාදන උපනතීන්ට අනුව උච්චාවචනය විය. 1996 දී කම්හල් නිමැවුමේහි එකතු වූ අගය සියයට 7.3 කින් වර්ධනය වූ අතර එය නිෂ්පාදන කර්මාන්ත අංශයෙහි වර්ධනයෙන් සියයට 90 කට වඩා වැඩි ප්‍රමාණයකට දායක විය. වැවිලි නොවන නිෂ්පාදන සැකසුම් අංශයෙහි ද වර්ධන ප්‍රවණතාවයන් දැකිය හැකිවිය. පළතුරු සැකසුම් වැනි සමහර කර්මාන්ත ඉතා ඉහළ මට්ටමකට වැඩි දියුණු වී ඇත. පෙරදී මෙන්ම 1996 දී ද නිෂ්පාදන කර්මාන්තයන්හි වර්ධනය අපනයන පෙරදැරි කර ගත් එකක් විය.

1996 දී දිගු කාලයක් පැවති විදුලි බල කපාහැරීමේ අහිතකර බලපෑම මධ්‍යයේ වුව ද, කර්මාන්ත නිමවුම සියයට 7.3 කින් වර්ධනය විය. මේ හා සැසඳෙන 1995 වර්ෂයට අදාළ වර්ධන වේගය සියයට 10.2 ක් විය. පෞද්ගලික අංශය මගින් විදුලිය උත්පාදනය උනන්දු කිරීම සඳහා සපයන ලද ආනයන බදු සහන, ජාතික සංවර්ධන බැංකුව මගින් සහ සංවර්ධන මූල්‍ය සමායතනය මගින් විදුලි උත්පාදන යන්ත්‍ර ආනයනය කිරීම සඳහා සපයන ලද විශේෂ ණය පහසුකම් සහ පෞද්ගලික අංශය මගින් උත්පාදනය කරන ලද විදුලිය ජාතික විදුලිබල පද්ධතිය සඳහා වැඩි මිලකට මිල දී ගැනීම මගින් වක්‍ර ආකාරයෙන් සපයන ලද සහනාධාර වැනි ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් වශයෙන්, විදුලිය කපා හැරීම හේතුවෙන් කාර්මික නිෂ්පාදනයට සිදුවූ අලාභය අඩුකර ගැනීමට හැකිවිය. විදුලිය කපා හැරීම අඩුවෙන් බලපාන ලද අපනයන සැකසීමේ කලාපවල කාර්මික නිෂ්පාදනයේ සිදු වූ සියයට 10 ක වැඩිවීම 1996 වර්ෂයේ කාර්මික නිෂ්පාදන වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. අනෙකුත් කර්මාන්තයන්හි නිමැවුම සියයට 3.7 කින් වර්ධනය විය. රජයට අයත් ඛනිජ තෙල් පිරිපහදුව බාධාවකින් තොරව ක්‍රියාත්මක වීමත්, අපනයන සැකසුම් කලාපයෙන් පිටත පිහිටි පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි කාර්මික නිෂ්පාදනයෙහි සිදුවූ සාමාන්‍ය වර්ධනයත්, සමස්ත කාර්මික නිෂ්පාදනය සඳහා සැලකිය යුතු ලෙස දායක විය. සමස්ත කාර්මික නිෂ්පාදනයෙන් සියයට 83 කට පමණ දායක වූ කම්හල් නිමැවුම 1996 වර්ෂයේ ආර්ථික වර්ධනයෙන් සියයට 33 කට පමණ දායක විය. සම්පූර්ණයෙන් ගණනය කිරීමට හසු නොවූ සුළු සහ මධ්‍යම පරිමාණ කර්මාන්ත අංශය සියයට 6.3 කින් වර්ධනය විය.

ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති ආයතනවල දැනට කර ඇති ආයෝජනවල සිදුවී ඇති කැපී පෙනෙන වර්ධනය අපනයන පෙරදැරි කරගත් කර්මාන්තවල වර්ධනය කෙරෙහි විශාල වශයෙන් දායක විය. එමෙන්ම ඇමරිකා එක්සත් ජනපදය සහ අනෙකුත් බටහිර රටවල ඉල්ලුමේ සිදු වූ වර්ධනය ද අපනයනය පෙරදැරි කරගත් කර්මාන්තවල වර්ධනය සඳහා උපකාරී විය. කෙසේ වෙතත් 1996 වර්ෂයේ දී කාර්මික නිෂ්පාදනයේ සිදු වූ තාවකාලික පසුබෑයීම හේතුවෙන් මෙම වාසිය සම්පූර්ණ වශයෙන් ලබා ගැනීමට නොහැකි විය. ශ්‍රී ලංකා රුපියලේ මඳ වශයෙන් සිදුවූ අවප්‍රමාන වීම ද අපනයන අංශය සඳහා උපකාරී විය. පෙර වර්ෂය සමග සසඳන කල 1996 වර්ෂයේ දී කම්කරු ආරවුල් ප්‍රමාණය අඩු මට්ටමක පැවතුණි. යටිතල පහසුකම් හිඟය කාර්මික අංශයේ සීග්‍ර වර්ධනය සඳහා වූ ප්‍රධාන බාධකයක් වශයෙන් තවදුරටත් පැවැතිණි.

1995 වර්ෂයේ දී ලබාගත් 14.8 ක වර්ධන වේගය හා සසඳන කල රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන කර්මාන්තයන් 1996 දී මූර්ත වශයෙන් සියයට 5.1 කින් වර්ධනය විය. මෙම කාණ්ඩයේ ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්තයන්හි සියයට 6 ක වර්ධනයක් වාර්තා වූ අතර, ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්තයන්හි සියයට 1.7 ක වර්ධනයක් දැකිය හැකිවිය. 1996 දී තරමක අඩු වර්ධනයක් පෙන්නුම් කළ ද, මෙම කාණ්ඩය සමස්ත කාර්මික නිෂ්පාදනයෙන් සියයට 39 කට දායක වූ අතර, පෞද්ගලික අංශයේ කාර්මික නිමැවුම් වර්ධනය සඳහා සියයට 34 කින් දායක විය.

1996 දී ආහාර, පාන වර්ග සහ දුම්කොළ කාණ්ඩය සියයට 6.9 කින් වර්ධනය වූ අතර, එය පෞද්ගලික අංශයේ කාර්මික නිමැවුමෙහි වර්ධනයෙන් සියයට 27 කට දායකවිය. සකස් කළ දුම්කොළ හා සිගරැට්, සීටීසී (කපා, ඉරා, අඹරන ලද) තේ හා තේ මලු, බීර සහ මත්පැන්, කිරි නිෂ්පාදිත, සකස් කළ පොල් හා මස් නිෂ්පාදනයන්හි යහපත් වර්ධනයක් දැකිය හැකිවිය. සිගරැට් මත පනවන ලද ඉහළ බදු තත්ත්වයන් යටතේ පවා දුම්කොළ සැකසුම් නිෂ්පාදනය සියයට 5.7 කින් වර්ධනය විය. 1995 නොවැම්බර් මාසයේ දී බීර මත පනවා තිබූ බදු අඩු කිරීමෙන් ඉහළ ගිය දේශීය ඉල්ලුම නිසා, දේශීය නිෂ්පාදනය සියයට 70 කින් වැඩිවිය. 1996 දී පැවැති ඉහළ නිෂ්පාදන මට්ටමෙහි සහ ඉහළ මිල ගණන්වල ප්‍රතිඵලයක් ලෙස, තේ සැකසීම ආශ්‍රිත කර්මාන්තවල වර්ධනයක් දැකිය හැකිවිය. විදුලි බලය කපා හරින ලද කාලයේදී අපහසුතාවලට මුහුණ දුන් මස් සැකසීම ආශ්‍රිත කර්මාන්ත, වසරේ දෙවන භාගයේ දී මුළුමනින්ම යථා තත්ත්වයට පත් විය. පාන් මිලෙහි ඉහළ සහනාධාර ප්‍රමාණයන් පැවැතිමේ හේතුවෙන් පාන් සඳහා ඉහළ ඉල්ලුමක් පැවැතුන 1995 වසරට සාපේක්ෂව අඩු තිරිඟු ප්‍රමාණයක් ආනයනය කිරීම හේතුවෙන් තිරිඟු පිටි සැකසීමේ කර්මාන්තයේ නිමැවුම පහත වැටින.

ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්තයන්හි නිමැවුමෙහි කැපී

පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරමින්, පෞද්ගලික අංශයේ රසායනික කාණ්ඩයෙහි නිෂ්පාදන වටිනාකම සියයට 14.2 කින් වර්ධනය විය. ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත කාණ්ඩය 1996 දී සියයට 6.7 ක වර්ධනයක් ලබා ඇත. දිස්න යෙදූ පිගන් ගඩොල්, පෝසිලේන් ප්‍රතිමා, මැටි භාණ්ඩ, සකස් කළ සිලිකා ඇතුරුම් සහ කුට්ටි කරන ලද කළුගල් නිෂ්පාදිතයන්හි ඉහළ නිමැවුම් වර්ධනයක් පෙන්නුම් කළේය. පිගන් ගඩොල් සහ අනෙකුත් පිගන් නිෂ්පාදිත, වහල සෙවිලි කිරීමේ නිෂ්පාදිත මෙන්ම සිමෙන්ති නිෂ්පාදනය ද, දේශීය ඉදිකිරීම් කර්මාන්ත තුළින් ඇතිවූ ඉහළ ඉල්ලුම සපුරාලිය හැකි වන පරිදි වර්ධනය විය.

ආයෝජන මණ්ඩලයට යටතේ නොවන කර්මාන්ත අංශයෙහි නිෂ්පාදන ධාරිතාවය සියයට 2 කින් වැඩි වූ අතර, ප්‍රධාන වශයෙන්ම විදුලි බලය කපා හැරීම හේතුවෙන් ධාරිතා උපයෝජන අනුපාතය 1995 දී සියයට 84 සිට 1996 දී සියයට 83 ක් දක්වා සුළු වශයෙන් අඩු විය.

ආයෝජන මණ්ඩලය යටතේ නොවන කර්මාන්ත අංශයෙහි, සාමාන්‍ය කම්හල් ලාභදායීතාවය (ලාභය මුළු නිෂ්පාදන පිරිවැයෙහි අනුපාතයක් ලෙස) නිෂ්පාදන පිරිවැය සියයට 18 කින් හා කම්හලෙන් පිටවන විට නිෂ්පාදන වටිනාකම සියයට 17 කින් ඉහළයාමක් පිළිබිඹු කරමින්, 1995 වසරෙහි වූ සියයට 16.2 හි සිට 1996 වසරේ දී සියයට 14.7 දක්වා පහත වැටුණි. කර්මාන්ත අතර ලාභදායීත්වය සියයට 10 සිට සියයට 23 දක්වා වෙනස් විය. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන කාණ්ඩය සියයට 23 ක් වන ඉහළම ලාභදායීතා අනුපාතයක් වාර්තා කළ ද, එය 1995 වසරෙහි පැවැති සියයට 24 ට වඩා සුළු වශයෙන් අඩු විය.

විදුලිය කැපීම නිසා නිෂ්පාදනයට බාධා ඇති වුවද, ව්‍යවසායකයින් සේවකයින් සංඛ්‍යාව තමාට හැකියාව ඇති උපරිම මට්ටමක පවත්වා ගෙන යනු ලැබීම් හේතුවෙන්, ආයෝජන මණ්ඩලය යටතේ නොවන කර්මාන්තවල ශ්‍රම ඵලදායීතාව, 1996 වර්ෂයේ දී සියයට 1.1 කින් අඩු වී ඇති බවට ඇස්තමේන්තු කර ඇත. 1995 වර්ෂයේ සියයට 10.2 ක් වූ ආයෝජන මණ්ඩලය යටතේ නොවන කර්මාන්තවල මූර්ත එකතු කළ අගයේ වර්ධනය මෙම වර්ෂයේ දී සියයට 7.3 දක්වා අඩු වුව ද, ශ්‍රම ඵලදායීතාවයේ පහත වැටීමක් ජනිත කරමින් ශ්‍රමික සංඛ්‍යාව අඩුවූයේ සියයට 1.7 කින් පමණි.

ඉදිකිරීම්

1995 දී පැවැති සියයට 4.9 ක වර්ධනය හා සසඳන කල, ඉදිකිරීම් අංශය සියයට 3.4 කින් පුළුල් විය. ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් රාජ්‍ය ආයෝජන කටයුතු මන්දගාමීවීම සහ පෞද්ගලික අංශයේ ආයෝජන ක්‍රියාකාරකම් පහත වැටීම ද ඉදිකිරීම් අංශයේ ප්‍රවණතා තුළින් තරමක් දුරට පිළිබිඹු විය. සිමෙන්ති සහ ඇස්බැස්ටෝස් වැනි මූලික අමුද්‍රව්‍යයන්ගේ සැපයුම පිළිබඳ ඇස්තමේන්තු මගින් ද ඉදිකිරීම් අංශයේ අඩු වර්ධනය තහවුරු කෙරේ. වසරේ අවසාන භාගයේ දී ආයෝජන කටයුතු යථා තත්ත්වයට පැමිණි බව දක්වන සමහර සාධක විය.

සේවා

ප්‍රධාන වශයෙන් ජල විදුලිබල උත්පාදනයේ වූ සියයට 28 ක පහත වැටීම හේතුකොට ගෙන විදුලිය, ගෑස් සහ ජල සම්පාදන සේවා උප අංශයෙන් එකතු කළ වටිනාකම සියයට 2 කින් පහත වැටුණි. මෙම පහත වැටීම තරමක් දුරට සමනය කිරීමට අමතර තාපබල උත්පාදනය සහ පෙර සඳහන් ආකර්ශණීය සානුබල පිරිනැමීමෙන් ස්වයං බලශක්ති උත්පාදනය දිරිගැන්වීම හේතු විය. සෙලියුලර් දුරකථන, රැහැන් රහිත දුරකථන, දත්ත සංනිවේදන සේවා, පොදු දුරකතන කුටි, අන්තර් ජාල පහසුකම් ආදී විවිධ වර්ගයේ විදුලි සංදේශ සේවාවන්ගේ වූ සීඝ්‍ර වර්ධනය පිළිබිඹු කරමින් සංනිවේදන සේවා සියයට 25 ක වර්ධනයක් වාර්තා කළේය. මෙම අංශය ඉහළ වර්ධනයකට ඉඩකඩ ඇති අංශයකි. සමස්තයක් වශයෙන් ප්‍රවාහන උප අංශය සියයට 4.7 ක වර්ධන අනුපාතිකයක් වාර්තා කළේය.

බැංකු සහ රක්ෂණ අංශය මෑත කාලයේ දී පැවැති ක්‍රියාශීලී අංශ අතුරින් එකක් විය. පසුගිය වසරේ දී මෙන්ම, සියයට 10.1 ක වර්ධන අනුපාතිකයක් ලඟා කරගත් මෙම අංශය දළ දේශීය නිෂ්පාදිතයෙන් හිමිකරගත් සාපේක්ෂ කොටස 1980 ගණන්වල මුල් කාලයේ දී සියයට 3.2 සිට 1996 දී සියයට 6 කට වඩා වැඩිවිය. 1996 දී රක්ෂණ උප අංශය සියයට 9.5 කින් වර්ධනය විය. ආර්ථිකය මන්දගාමී වීම මෙම අංශ දෙකටම සාමාන්‍යයෙන් බලපානු ලැබිණ.

ආයෝජන සහ ඉතුරුම්

නියගය, විදුලිය කපා හැරීම් සහ රාජ්‍ය ආයෝජන කටයුතුවල මන්දගාමීත්වය මගින් ඇති වූ අවිනිශ්චිතතාවයන් හේතු කොටගෙන 1996 දී ශ්‍රී ලංකාවේ ආයෝජන කටයුතු පහත් මට්ටමක පැවතුණි. ආයෝජන මණ්ඩල නොවන අංශයේ ආයෝජන ක්‍රියාකාරකම්, වසරේ දෙවන භාගයේ දී යළිත් යථා තත්ත්වයට පත්වීම ඇරඹුණි. ආයෝජන භාණ්ඩ ආනයන වර්ධනය මගින් මෙම ප්‍රවනතාවය සනිටුහන් කරනු ලැබිණ. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය ඉකුත් වසරේ දී පැවැති දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 25.7 සිට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 24.2 දක්වා සුළු වශයෙන් අඩුවිය. අවිනිශ්චිතතාවයන් හේතුවෙන් ආයෝජන ප්‍රමාද කිරීම සඳහා පැවැති ප්‍රවණතාවය නිසා පෞද්ගලික අංශයේ ආයෝජනවල පහත වැටීම ඉහළ මට්ටමක පැවතුණි. එසේ වුව ද පෞද්ගලික අංශයේ සෘජු විදේශීය ආයෝජන වැඩිවිය. එහෙත් එම ආයෝජන සුළු මට්ටමක පැවතුණි. (මුළු ආයෝජනයෙන් සියයට 3.7 ක් හෙවත් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.9 ක්)

දළ දේශීය ඉතිරිකිරීම් අනුපාතය 1995 දී සියයට 15.3 සිට 1996 දී සියයට 15.5 දක්වා සුළු වශයෙන් වර්ධනය විය. ජංගම ගිණුම් හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතිකයක් වශයෙන් සියයට 2.7 සිට 1996 දී සියයට 3.2 දක්වා ඉහළ යාම තුළින් රජයේ සෘණ ඉතිරිකිරීම්වල වැඩිවීම පිළිබිඹු කෙරුණි. විශේෂයෙන්ම වැවිලි අංශයේ ව්‍යාපාරික ඉතිරිකිරීම්වල ඉහළයාම පිළිබිඹු කරමින් 1996 දී දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව පෞද්ගලික ඉතුරුම් ඉහළ ගියේ ය.

මිල

නියගය හේතුවෙන් දේශීය ආහාර ද්‍රව්‍ය සැපයුමෙහි ඇති වූ තාවකාලික හිඟය, තිරිඟු පිටි, භූමිතෙල් ඇතුළු ඉන්ධන, විදුලිය සහ ප්‍රවාහන ගාස්තුවල පරිපාලන මිළ ඉහළ දැමීමෙන් කරන ලද මිල නිවැරදි කිරීමේ ගැලපීම්, ආනයනය මිල ගණන් ඉහළයාම සහ සමහර අංශවල පැවැති ඉහළ වේතන හා ඉහළ බලශක්ති පිරිවැය හේතුකොට නිෂ්පාදන පිරිවැය වැඩිවීම නිසා 1996 දී සාමාන්‍ය මිල මට්ටම තීව්‍ර ලෙස ඉහළ නැගුණි.

රූප සටහන 1.3

ආයෝජනය හා ඉතිරිකිරීම් (වාර්ෂික)



අගනුවර සේවකයින්ගේ ජීවන තත්ත්වය පිළිබිඹු කරමින් කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) සියයට 15.9 ක සාමාන්‍ය වාර්ෂික උද්ධමන අනුපාතයක් පෙන්නුම් කළ අතර මෙය 1995 දී සියයට 7.7 ක් විය. අනෙකුත් මිල දර්ශකයන් ද මේ හා සමාන උපනතියක් පෙන්නුම් කරන ලදී. කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයෙහි වැඩිවීමෙන් සියයට 80 කට වඩා දායක වුයේ ආහාර ද්‍රව්‍ය මිල ඉහළයාමය. මීට අමතරව, ජාත්‍යන්තර තිරිඟු මිලෙහි ඇති වූ තියුණු වැඩිවීම හේතුකොට අයවැය මත පැටවෙන බර අඩු කිරීම පිණිස, දේශීය තිරිඟු පිටි මිල ඉහළ නැංවීමට රජයට සිදුවිය. මෙම වෙනස්වීම කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය ප්‍රතිශතක ඒකක 2.2 කින් ඉහළ නැංවීමට දායක විය.

වඩා පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය කරනු ලබන මහ කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය (ම.කො.පා.මි.ද.) කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයට සමාන උපනතියක් පෙන්නුම් කරමින් 1996 දී සියයට 14.7 කින් වර්ධනය විය. තොග අලෙවි මිල දර්ශකය (තො.මි.ද.) වර්ෂය තුළ දී සියයට 20.5 කින් වර්ධනය විය. පාරිභෝගික මිල දර්ශකයන් හා සසඳන කල තොග අලෙවි මිල දර්ශකය ඉහළ වර්ධන වේගයක් දැක්වීමට ප්‍රධාන හේතුව වුයේ අපනයන මිල ගණන් ඉහළ යාමය. වඩා පුළුල් භාණ්ඩ හා සේවාවන් ප්‍රමාණයක් ආවරණය කෙරෙන දළ දේශීය නිෂ්පාදිත අවධමනකය (ද.දේ.නි.අ.) 1996 දී සියයට 12.1 කින් ඉහළ නැගුණි.

මිල නිවැරදි කිරීමේ ගැලපීම් කරනු නොලැබුවේ නම් මිලෙහි ඇතිවන ක්ෂණික වැඩිවීම මීට වඩා බොහෝ සේ අඩුවීමට ඉඩ තිබුණි. එසේ වුවා නම් මෙම තත්ත්වය යටතේ තිරිඟු පිටි සහනාධාරය පිණිස දැරීමට සිදුවන අමතර පිරිවැය පියවීම සඳහා රජයට ප්‍රසාරණාත්මක මුල්‍යකරණයන් යොදා ගැනීමට සිදුවිය හැකිව තිබුන අතර, මෙමගින් සාර්ව ආර්ථික කළමනාකරණය ව්‍යාකූල කරමින් ආර්ථිකයෙහි උද්ධමනකාරී පීඩනය තවදුරටත් වැඩි වීමට ඉඩ තිබුණි. පරිපාලන මිල ගණන් ඉහළ නැංවීම, කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය සියයට 29 කින් ඉහළ යාමට දායක විය.

සීනි, සහල් සහ කෑමට සුදුසු තෙල්වර්ග සඳහා තීරුබදු සහනයන් ලබාදීම සහ අර්තාපල්, ළූණු සහ මිරිස් මත පැවැති බලපත්‍ර අවශ්‍යතාව ඉවත් කිරීම, සැපයුම් තත්ත්වයන් යහපත් කිරීමට සහ නියගයෙහි උද්ධමනකාරී ප්‍රතිවිපාක අඩු කිරීමට හේතු විය. මේ අතර වර්ෂයෙහි දෙවන භාගයෙහි පැවැති මුල්‍ය ප්‍රසාරණ වේගයෙහි තියුණු අඩුවීම, මිල මත පැවැති ඉල්ලුම් පීඩනය සැලකිය යුතු ලෙස ලිහිල් කළේය. සැප්තැම්බරයේ දී ඉහළ මට්ටමට නැගුණු මිල මට්ටමේ ප්‍රසාරණය අවසාන කාර්තුවේ දී තියුණු ලෙස

රූප සටහන 1.4
මිල වෙනස්වීම





පහත වැටුණි. සියළුම මිල දර්ශකයන්හි මෙම පහත වැටීම පිළිබිඹු කෙරේ. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙන් පිළිබිඹු වන පරිදි, 1996 සැප්තැම්බරයෙහි පැවැති සියයට 21.5 ක් වූ ලක්ෂමය පදනම මත උද්ධමනය දෙසැම්බර් මස වනවිට සියයට 16.8 දක්වා පහත වැටුණි.

වැටුප්

1995 වර්ෂයේ දී සියයට 28 ක වැටුප් වර්ධනයක් ලබාගත් රාජ්‍ය අංශයේ ගුරුවරුන්ගේ හැර අනිකුත් සියළුම සේවක කාණ්ඩයන්හි සාමාන්‍ය නාමික වැටුප් 1995 වර්ෂයට වඩා ඉහළ ගියේ ය. කෙසේ වෙතත් ඉහළ උද්ධමනය හේතුවෙන් මින් ලැබූ සමහර වාසි අහිමි විය. 1996 වසරේ දී රජයේ සේවකයින්ගේ වැටුප් නොවෙනස්ව පැවතුණි. සංවිධිත පෞද්ගලික අංශයට අයත් වැවිලි කර්මාන්ත සේවක වැටුප්වල ඉහළ යාමක් දක්නට ලැබුණි. එසේම ගිනිපෙට්ටි නිපදවීමේ කර්මාන්තය, චී කෙටීම් කර්මාන්තය හා පුවත්පත් කලාවේදීන්ගේ වෘත්තියට අයත් සේවකයින්ගේ වැටුප් වැඩිවිය. අසංවිධිත අංශයේ නාමික වැටුප් වර්ධනය සීඝ්‍ර වැඩිවීමක් දැක්විය.

ඉහත සඳහන් සංශෝධනයන්ට අනුරූපව, සංවිධිත පෞද්ගලික



අංශයේ සේවක වැටුප් මගින් ලබන. සියළුම පළාත් පාලන සභාවන්ගෙන් ආවරණය වන සේවකයින්ගේ අවම වැටුප් පරිමාන දර්ශකය 1996 දී නාමික වශයෙන් සාමාන්‍යයෙන් සියයට 8.3 කින් වැඩිවිය. වැවිලි කර්මාන්ත අංශයේ සේවක වැටුප් වැඩිවීම පිළිබිඹු කරමින් කෘෂිකර්මයෙහි යෙදී සිටින කම්කරුවන්ගේ වැටුප් සියයට 9.3 කින් ඉහළ ගියේය. වසර තුළ දී කර්මාන්ත හා වාණිජ යන අංශවල සේවක වැටුප් සියයට 4.8 කින් ඉහළ ගියේ ය. 1996 දී සේවා අංශයේ සේවක වැටුප් සියයට 6.7 කින් ඉහළ නැගුණි.

ශ්‍රී ලංකා මහබැංකුව මගින් පවත්වනු ලබන දිප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල යටතේ ලැබුණු, සුළුපරිමාණ ඉදිකිරීම් කටයුතු වලට අදාල තාවකාලික දත්තවලට අනුව වඩු කාර්මිකයින් හා මේසන්වරුන්ගේ වැටුප් සියයට 14-15 කින් වැඩිවී ඇති අතර නුපුහුණු අත් උදව්කරුවන්ගේ වැටුප් සියයට 13 කින් ඉහළ ගොස් ඇත. තේ, පොල් හා රබර් යන වැවිලි අංශවල වැටුප් සියයට 8 ත්, 10 ත් අතර ප්‍රමාණයකින් වැඩි වී ඇති අතර වී වගාව ආශ්‍රිත බොහෝ කටයුතු සඳහා ලැබුණු වැටුප්වල වර්ධනය සියයට 6 ත්, 13 ත් අතර ප්‍රමාණයක් විය.

ශ්‍රම බලකාය හා සේවා නියුක්තිය

ශ්‍රී ලංකාවේ මුළු ජනගහනය වන දශ ලක්ෂ 18.315 සමග ශ්‍රී ලංකාව සතු ශ්‍රම බලකාය දශ ලක්ෂ 6.2 ක් පමණ විය. (1996 තෙවන කාර්තුව අවසානයට) මෙම ශ්‍රම බලකායෙන් දශ ලක්ෂ 5.5 ක් හෙවත් සියයට 88 ක් සේවා නියුක්තිකයන් විය. ශ්‍රම බලකායේ සහභාගිත්ව අනුපාතය හෙවත් මුළු ජනගහනයෙන් වැඩ කිරීමට හැකි ප්‍රතිශතය සියයට 48.6 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

1996 මැද භාගයේ දී පැවැති ආර්ථික කටයුතුවල මන්දගාමීත්වය රැකියා උත්පාදනයේ අඩුවීම සඳහා බලපෑ ප්‍රධාන බාධකය විය. පසුගිය වසර පහ තුළ දී දළ දේශීය නිෂ්පාදිතයේ වාර්ෂික සාමාන්‍ය වර්ධන වේගය වූ සියයට 5.5 ක් සමග වාර්ෂික රැකියා අවස්ථාවන්ගේ වර්ධනය සියයට 1.7 ක් විය. මේ අනුව රැකියා අවස්ථාවන් ප්‍රතිශතාංක 1 කින් වැඩි කිරීමට වර්ධන අනුපාතය සියයට 3.5 ත්, 4.0 ත් අතර වූ ආර්ථික වර්ධනයක් වීම අවශ්‍ය බව පෙනී යයි. පසුගිය වසර පහේ පැවැති සාමාන්‍ය වාර්ෂික උත්පාදනය වූ නව රැකියා අවස්ථාවන් 90,000 ට සාපේක්ෂව, 1996 වසරේ පැවැති වර්ධන වේගය වන සියයට 3.8 ට අනුරූපව ආර්ථිකයේ නව රැකියා අවස්ථාවන් 75,000 ක් පමණ උත්පාදනය



වූ බවට ඇස්තමේන්තු කර ඇත. රාජ්‍ය අංශයේ සාපේක්ෂ ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩු වූ හෙයින් මෙම මුළු රැකියා උත්පාදනයට මුළුමනින්ම පාහේ පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකම් ප්‍රසාරණය වීම ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම රැකියා අවස්ථා වැඩිවීම සඳහා ආයෝජන මණ්ඩලය යටතට ගැනෙන කර්මාන්ත වලින් වූ දායකත්වය සියයට 11 කි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවලට අනුව 1996 තෙවැනි කාර්තුව අවසානයේ දී රැකියා වියුක්ති අනුපාතය සියයට 11.6 දක්වා අඩු වී ඇත. මෙම පහත වැටීම සඳහා බලපෑ ප්‍රධාන සාධක වූයේ අසංවිධිත අංශයේ ආර්ථික කටයුතුවල වර්ධනය සහ විදේශ සේවාවන් සඳහා සංක්‍රමණයවීම් වැඩිවීමය.

ශ්‍රී ලංකා විදේශ නියුක්ති කාර්යාංශයේ දත්තයන්ට අනුව 1996 දී විදේශයන්හි රැකියා සඳහා පිටත්ව ගිය මුළු සංඛ්‍යාව 162,511 කි. මෙය 1995 දී පිටරට ගියේ යැයි වාර්තා වී ඇති සංඛ්‍යාව වන 170,130 ට වඩා අඩුය. එහෙත් කාර්යාංශය මගින් ක්‍රියාත්මක කළ ලියාපදිංචි කිරීමේ ක්‍රමය 1996 වසරේ සිට ලිහිල් කිරීම නිසා විදේශ සේවයට මේ වසරේ ගිය සංඛ්‍යාව මුළුමනින්ම වාර්තා නොවීමට ඉඩ ඇති අතර නිවැරදි සංඛ්‍යාව මෙයට වඩා වැඩිවිය හැකිය. මේ අතර මැදපෙරදිග රටවල සේවාවන් සඳහා පිටත්ව ගිය සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වූ අතර විදේශ ශ්‍රමය සඳහා ඉල්ලුම් මුලාශ්‍රයක් වශයෙන් මාලදිවයින, සිංගප්පූරුව, හොංකොං සහ ඉතාලිය යන රටවල වැදගත්කම වැඩි විය.

ඉදිරි වර්ෂ පහ තුළ වාර්ෂිකව නව රැකියා අවස්ථාවන් 90,000 ක් උත්පාදනය කිරීමට හැකි වුවහොත්, දැනට පවතින සේවා වියුක්ති අනුපාතය වැඩි නොවීමට ඉඩ ඇත. කෙසේ වෙතත්, මින් අදහස් වන්නේ වසර 2001 දී සේවා වියුක්ති සංඛ්‍යාව 782,000 දක්වා නිරපේක්ෂව වැඩිවිය හැකි බවය. රජයක ප්‍රධාන පරමාර්ථයක් වනුයේ සේවා වියුක්ති අනුපාතය සැලකිය යුතු ලෙය අඩු කිරීමයි. සේවා වියුක්ති අනුපාතය සියයට 6 දක්වා පහත හෙළීමට නම් ආර්ථිකය විසින් වාර්ෂිකව රැකියා අවස්ථා 158,000 ක් උත්පාදනය කළ යුතු වේ. දැනට පවත්නා ශ්‍රම උපයෝගී පරිමාව මත (එනම් ආර්ථික වර්ධනයේ සෑම සියයට 3.7 ක වැඩිවීමක් සඳහා ම සේවා නියුක්තියේ සියයට 1 ක වැඩිවීමක්) වසර 2001 දී සේවා වියුක්ති අනුපාතය සියයට 6 ක් දක්වා අඩු කර ගැනීමට නම් මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ සියයට 7ක වාර්ෂික වර්ධන අනුපාතයක් අවශ්‍ය වනු ඇත.

1.3 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ අයවැය කටයුතු

මැදි කාලීන රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධතා රාමුව තුළ, පෞද්ගලික අංශය ප්‍රමුඛ කරගත්, විදේශ අංශයෙහි යහපත් පැවැත්මක් සහිත උද්ධමනයෙන් තොර ආර්ථික වර්ධනයකට පදනම දැමීම සඳහා අයවැය හිඟය තිරසාර ලෙස අඩු කිරීමේ මාවතට යොමු කිරීම රජයේ රාජ්‍ය මූල්‍ය කාර්ය සාධකයෙන් ඉලක්ක කරගනු ලැබිණ. පසුගිය වසර දෙක තුළ දී රාජ්‍ය මූල්‍ය අංශයේ තරමක පසුබෑමක් දක්නට ලැබුණි. ඉලක්ක කරන ලද අයවැය හිඟය සහ අදාල වර්ෂයේ දී වූ අයවැය හිඟය හා සංසන්දනය කිරීමේ දී, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 1994 දී සියයට 3.2 ක සහ 1995 දී සියයට 2.1 ක ප්‍රමාණයකින් අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගැනීමට නොහැකි විය. 1996 අයවැය මගින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණයන්හි කැපී පෙනෙන වර්ධනයක් සහ අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් සියයට 6.6 දක්වා (දීමනාවලට පෙර සියයට 7.8) අඩු කිරීමට බලාපොරොත්තු විය. අයවැය හිඟය බැංකු නොවන මුලාශ්‍රයන් මගින් මූල්‍යකරණය කිරීමට අපේක්ෂා කරන ලදී. 1996 දී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල තරමක වර්ධනයක් පෙන්නුම් කෙරේ. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 7.8 වූ නිෂ්කාශිත සමස්ත අයවැය හිඟය (දීමනාවලට පෙර සියයට 8.9) 1995 ට වඩා අඩු වූ නමුත්, 1996 දී අපේක්ෂිත අයවැය හිඟයට ලගා විය නොහැකි විය. මෙයට ප්‍රධාන වශයෙන් ආරක්ෂක වියදම් තියුණු ලෙස ඉහළ යාම, ජාත්‍යන්තර තිරිඟු මිල ගණන් දැඩි ලෙස ඉහළ යාම නිසා දැරිය යුතු තිරිඟු පිටි සහනාධාර වැඩිවීම, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය යටතේ

සංඛ්‍යා සටහන 1.4
රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වයේ සාරාංශය
(ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙනි)

	1985	1990	1995	1996 (අ)
මුළු ආදායම	22.4	21.1	20.4	19.0
වර්තන වියදම	20.1	22.3	23.1	22.2
පොලී ගෙවීම	4.6	6.4	5.7	6.0
වැටුප් සහ වේතන	4.2	4.9	5.2	5.0
ආරක්ෂක අංශය	0.3	0.7	1.8	1.7
ආරක්ෂක නොවන අංශය	3.9	4.1	3.4	3.3
වේතන හැර ආරක්ෂක වියදම්	2.5	1.4	4.6	4.0
විශ්‍රාම වැටුප්	1.7	1.4	2.2	2.0
ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම්	14.0	8.7	6.9	5.7
වර්තන ගිණුමේ අතිරික්තය / හිඟය (-)	-2.2	-1.2	-2.7	-3.2
අයවැය හිඟය (ප්‍රදානයන්ට පෙර)	-11.7	-9.9	-9.6	-8.9
අයවැය හිඟය (ආරක්ෂක වියදම් හැර)	-8.9	-7.8	-3.2	-3.2
ප්‍රාථමික අයවැය හිඟය	-7.1	-3.5	-3.9	-2.9
අයවැය හිඟය පියවීම	11.7	9.9	9.6	8.9
විදේශීය (ප්‍රදානයන් ඇතුළුව)	6.4	5.7	4.6	2.5
දේශීය	5.3	4.2	5.0	6.4
එයින් බැංකු	2.9	0.1	1.1	1.6

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

බලාපොරොත්තු වූ ලැබීම් අඩුවීම සහ දිගුකලක් පැවැති නියගය හා විදුලි බලය කපා හැරීම රජයේ ආදායමට අහිතකර ලෙස බලපෑම ආදිය හේතු විය. රාජ්‍ය අංශයේ මුළු වියදම, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 1995 පැවැති සියයට 30 සිට සියයට 27.9 දක්වා පහත වැටුණු අතර, මුළු ආදායම ඉකුත් වසරේ පැවැති සියයට 20.4 සිට සියයට 19.0 දක්වා පහත වැටුණි. දේශීය සම්පත් සීමාවීම සහ විශේෂයෙන්ම බලශක්තිය, විදුලි සංදේශ හා ජල සම්පාදනය වැනි අංශයන්හි ව්‍යපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් නිසා අයවැය කටයුතු සඳහා යොදගත් විදේශීය සම්පත් අඩුවිය. එබැවින් අයවැය හිගයෙන් සියයට 82 ක් දේශීය ණය ගැනීම් මගින් මූල්‍යකරණය කරන ලද අතර, එයට බැංකු අංශයෙන් මූල්‍යකරණය කරන ලද සියයට 21 ක ප්‍රමාණය ද ඇතුළත් වේ. 1997 අයවැය මගින් රාජ්‍ය මූල්‍ය අංශය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය යළිත් අවධාරණය කරන ලද අතර එමගින් මධ්‍යකාලීන අයවැය හිගය 1999 වසර සඳහා දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 3.5 ක් දක්වා අඩුකර ගැනීම ඉලක්ක කරන ලදී (දීමනා වලට පෙර දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් සියයට 4.5). 1997 දී අපේක්ෂිත සමස්ත අයවැය හිගය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6.1 කි (දීමනා වලට පෙර දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 7.3).

තිරිඟුවල ජාත්‍යන්තර මිළ ගණන් ඉහළයාම, ආරක්ෂක වියදම් ඉහළ නැගීම සහ නියගය හා විදුලිය බලය කපා හැරීම නිසා ඇති විය හැකි ආදායමේ හිගය වැනි අනපේක්ෂිත වර්ධනයන් රාජ්‍ය මූල්‍ය තත්ත්වයේ ප්‍රබල පිරිහීම කෙරෙහි බලපාන ලදී. මෙම තත්ත්වය මැඩලීම සඳහා විවිධාකාරවූ නව ආදායම් මාර්ග රජය විසින් ක්‍රියාත්මක කරන ලදී. සිගරැට් සහ සැර මත්පැන් මත සුරාබදු ඉහළ නංවන ලද අතර ප්‍රමුඛතා නොවන වියදම් කපා හරින ලදී. 1996 වර්ෂය තුළ දී තිරිඟු පිටි පරිපාලන මිල සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ නැංවීමට තීරණයක් ගන්නා ලද අතර, ඒ අනුව තිරිඟු පිටි මිල සියට 42 කින් වැඩි කරන ලදී. දැඩි මූල්‍ය විනයක් පවත්වා ගැනීම සඳහා දේශීය අංශයේ අතිරේක මූල්‍ය පහසුකම් අවශ්‍යව තිබියදීත්, රජය විසින් භාණ්ඩාගාර බිල්පත්වල නොපියවූ වටිනාකම් මට්ටම වූ රුපියල් දශලක්ෂ 125,000 ක සීමාව ඉහළ නොදමන ලදී. 1996 වර්ෂය තුළ දී නිවැරදි ප්‍රමිතීන් රාජ්‍ය මූල්‍ය අංශයෙහි හඳුන්වාදීමත් සමග සමස්ත අයවැය හිගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 7.8 කට සීමා කරගත් නමුත් එය 1996 අයවැය මගින් අපේක්ෂිත මට්ටමට වඩා සියයට 1.2 කින් ඉහළ යන ලදී.



රූප සටහන 1.7
රාජ්‍ය මූල්‍ය නිරීක්ෂණය

බදු අය කළ හැකි ආනයන ප්‍රමාණය සාපේක්ෂව අඩුවීම, විවිධ බදු සහනයන් සහ බදු නිදහස් කිරීම නිසා ආනයන භාණ්ඩ මත අය කරන සාමාන්‍ය බදු අනුපාතය පහත වැටීම සහ බදු නොවන ආදායමේ රැස්කරගත් ප්‍රමාණය අඩුවීමත් හේතුවෙන් රජයේ මුළු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 1995 දී සියයට 20.4 සිට 1996 දී සියයට 19.0 දක්වා පහත වැටිණ.

අනවශ්‍ය වියදම් කපා හැරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියා මාර්ග වල ප්‍රතිඵලයක් වශයෙන් පුනරාවර්තන වියදම්, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් පසුගිය වසරේ වූ සියයට 23.1 ක හා සසඳන විට මේ වසරේ දී සියයට 22.2 ක් දක්වා අඩුකර ගැනීමට හැකිවිය. මේ නිසා 1996 වර්ෂයේ දී වර්තන ගිණුමේ හිගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 3.2 ක් විය.

විදුලි සංදේශ සහ බලශක්ති අංශයන්හි විදේශ සම්පත් ඌණ උපයෝජනය ප්‍රධාන ලෙස පිළිබිඹු කරමින්, 1996 අයවැය මගින් අපේක්ෂිත දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 7.5 ක් වූ රාජ්‍ය ආයෝජන ප්‍රමාණය සියයට 6.2 දක්වා පහත වැටිණ. ශුද්ධ ණය දීම කාණ්ඩය යටතේ, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 0.6 ක ශුද්ධ ලැබීම් ප්‍රමාණයක් පුරෝකථනය කරන ලද නමුත්, පෞද්ගලිකරණ වැඩසටහනේ මන්දගාමී වර්ධනය නිසා, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 0.5 ක වියදමක් දක්නට ලැබිණ. රාජ්‍ය ආයෝජන, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 1.3 කින් අඩුවීම, අයවැය හිගය සීමාකර ගැනීමට දායක වූව ද, එය හිතකර ලක්ෂණයක් ලෙස දැකිය නොහැක.

අයවැය හිගය පියවා ගැනීම සඳහා ලබාගත හැකි වූ විදේශීය ශුද්ධ ණය ප්‍රමාණය 1995 දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 3.2 සිට 1996 දී සියයට 1.4 දක්වා පහළ වැටිනි. දේශීය සම්පත් ශුද්ධ උපයෝජනය 1995 දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 5.1 සිට 1996 දී සියයට 6.4 දක්වා වැඩිවිය. 1996 අයවැය මගින් බැංකු අංශයෙන් අයවැය හිගය පියවීමට අපේක්ෂා නොකළ ද, ඊට ප්‍රතිවිරුද්ධව යමින් 1996 දී රජය වෙත දෙන ලද බැංකු ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 12,344 ක් විය. බැංකු මූල්‍යකරණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ගත්විට 1995 දී සියයට 1.1 සිට 1996 දී සියයට 1.6 ක් විය. රුපියල් දශ ලක්ෂ 11,225 ක වටිනාකමින් යුත් නව භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයක් නිකුත් කිරීමත් සමග, භාණ්ඩාගාර බිල්පත්හි නොපියවූ වටිනාකම එහි අනුමත සීමාව වූ රුපියල් දශ ලක්ෂ 125,000 සීමාවට 1995 ඔක්තෝම්බර් මාසයේදී ළගා විය. මෙම භාණ්ඩාගාර බිල්පත් සීමාව සංශෝධනය නොකිරීම හේතුකොට ගෙන අයවැය පියවීම සඳහා රජය විසින් රාජ්‍ය අංශයේ ආයතනයන් සහ ව්‍යවස්ථාපිත අරමුදල් මගින් ණය ලබා ගන්නා ලදී. ඉදිරියට ගෙන යා යුතු රුපියල් දශ ලක්ෂ 2,715 ක් වූ වගකීම් ද ඇතුලත්ව 1996 දී එකී ණය ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 10,363 ක් විය.

1.4 ජාත්‍යන්තර වාතාවරණය හා විදේශීය අංශයේ වර්ධනයන්

ජාත්‍යන්තර ආර්ථික වාතාවරණය

ලෝක ආර්ථික වර්ධනය 1996 වර්ෂයේ දී සියයට 3.7 සිට සියයට 4.0 වර්ධනයක් පෙන්නුම් කරන ලදී. එහෙත් ඒ ඒ රටවල්වල මිශ්‍ර ක්‍රියාකාරීත්වයක් දක්නට ලැබුණි. කාර්මික රටවල් අතුරින් ජපානයේ හා ඇමරිකා එක්සත් ජනපදයේ ආර්ථිකයන් ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත් වීමක් දක්නට

ලැබුණු අතර, අනෙකුත් රටවල් හි ආර්ථිකයන්හි පසුබෑමක් පෙන්නුම් කෙරිණ. රජයන් විසින් මිල ස්ථාවරත්වය කෙරෙහි වැඩි කැප වීමකින් කටයුතු කළ අතර, උද්ධමනය යටපත් කොට තිබුණි. පසුගිය වසරේ ඉහළ මට්ටමක පැවැති ආසියානු නව කාර්මික රටවල ආර්ථික වර්ධනය සියයට 7.5 ක ඉහළ මට්ටමක සිට 1996 වර්ෂයේ දී සියයට 6.2 දක්වා මඳ වශයෙන් පහත වැටුණි. මේ අතර අප්‍රිකාවේ සංවර්ධනය වෙමින් පවත්නා රටවල වර්ධනය ආසන්න වශයෙන් සියයට 5 දක්වා ඉහළ නැංවුණු අතර ආසියාවේ සංවර්ධනය වෙමින් පවත්නා රටවල් 1995 වර්ෂයේ වූ සියයට 9 ක් පමණ වර්ධන මට්ටමේ සිට සියයට 8කට මඳක් වැඩි ප්‍රමාණයක් දක්වා පහත වැටුණි. පළමු වතාවට ඔවුන්ගේ වෙළඳපොල ප්‍රතිසංස්කරණයන්හි යම් ප්‍රගතියක් පෙන්නුම් කරමින්, පරිවර්තනය වෙමින් පවත්නා මධ්‍යම හා නැගෙනහිර යුරෝපීය රටවල් හා මධ්‍යම ආසියානු රටවල නිමැවුම් මඳ වශයෙන් වුව ද වැඩිවීමක් පෙන්නුම් කරන ලදී.

නිමැවුමෙහි සමස්ත වර්ධනයක් ඇති වුයේ, පහළ මට්ටමක පැවැති උද්ධමනය හා අඩුවෙමින් පැවැති පොලී අනුපාත සහ වැඩිවූ නිමැවුම් දේශීය පාරිභෝජනය සඳහා යොදා ගැනීමෙන් ලෝක වෙළෙඳාමට ඉදිරිපත් කරන ලද භාණ්ඩ හා සේවාවල වර්ධනය අඩුවීමත් පැවතුන තත්ත්වයක් යටතේ ය. කෙසේ වුව ද, මෙම වසර තුළ දී ප්‍රධාන වෙළෙඳ ද්‍රව්‍යවල ජාත්‍යන්තර මිල ගණන් උච්චාවචනයන්ට භාජනය විය. අධික ඉල්ලුම, පහත මට්ටමක පැවැති තොග සහ එක්සත් ජාතීන්ගේ ආහාර සඳහා තෙල් වැඩ පිළිවෙළ (United Nations Oil for Food Programme) යටතේ ඉරාකයෙන් තෙල් අපනයනය කිරීම දින නියමයක් නොමැතිව කල් දැමීම නිසා, අඩු වූ තොග සහ සැපයුමේ හිඟය හේතුවෙන් ඉන්ධන මිල මෙම වසර අග භාගය වන විට ශීඝ්‍රයෙන් වැඩිවිය. සැපයුම් තත්ත්වයන් හේතුවෙන් වසරේ මුල් භාගයේ දී ඉහළ ගිය තිරිඟු සහ සහල් මිල ගණන් පසුව ක්‍රමයෙන් අඩු වූ අතර, එමගින් විමසුමට ලක් කරන වර්ෂයේ සාමාන්‍ය මිල 1995 මිලට වඩා වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. 1995 වසරේ පහත් මට්ටමක පැවැති සීනි නිෂ්පාදනය 1996 වර්ෂයේ දී වැඩි වූ අතර, එය මිල ගණන් අඩුවීමට හේතු විය. මේ අතර, 1996 වසර තුළදී ලෝක තේ නිෂ්පාදනය සියයට 4කින් පමණ වැඩි වුවද, ලෝකයේ විශාලතම තේ පාරිභෝගිකයන් බවට පත් වූ ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් වලින් (ඉහත දී සෝවියට් සමූහාණ්ඩුවට අයත් වූ) පැවැති අඛණ්ඩ ඉහළ ඉල්ලුම නිසා ජාත්‍යන්තර තේ මිල ගණන්වල කැපී පෙනෙන වැඩිවීමක් සිදුවිය. 1996 වසර තුළ දී ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවලින් තේ සඳහා වූ ඉල්ලුම ශීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇතැයි ඇස්තමේන්තු කර ඇත. රබර් නිෂ්පාදනය කරන ප්‍රධාන රටවල අධි නිෂ්පාදනය සහ අඩු ඉල්ලුම නිසා රබර් සඳහා වූ ජාත්‍යන්තර මිල ගණන් 1995 පැවැති ඉතා ඉහළ මට්ටමට වඩා අඩුවිය. මීට ප්‍රතිවිරුද්ධව, පොල් නිෂ්පාදිතවල ජාත්‍යන්තර මිල ගණන් කැපී පෙනෙන ලෙස ඉහළ යාමට හේතු වූයේ අයහපත් කාලගුණික තත්ත්වයන් නිසා ලෝකයෙහි පොල් නිෂ්පාදිත අපනයනය කරන ප්‍රධාන රට වන පිලිපීනයේ සැපයුම අඩාල වීමයි.

1996 දී ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකක අතර විනිමය අනුපාතිකයන්ගේ වෙනස්වීම් ලෝකයේ ප්‍රධාන ආර්ථිකයන්හි තවදුරටත් දක්නට ලැබුණු චක්‍රීය තත්ත්වයන්ගේ සාපේක්ෂ අසමානතාවයන් තරමක් දුරට පිළිබිඹු කරන ලදී. ඇ. ඒ. ජ ඩොලරය බොහෝ ප්‍රධාන මුදල් වර්ගවලට සාපේක්ෂව ශක්තිමත් වුව ද, ස්ටර්ලින් පවුමට සාපේක්ෂව දුර්වලවිය. 1995 වර්ෂයේ මුල් කාලය තුළ ශීඝ්‍රයෙන් අතිප්‍රමාණ වූ ජපන් යෙන් හා ජර්මන් මාක් ජාත්‍යන්තර වශයෙන් නිවැරදි කරනු ලැබ 1996 වර්ෂයේ දී යථා තත්ත්වයට පත් විය. අඩු උද්ධමන පසුබිමක් තුළ පොලී අනුපාතික අඩු වී ස්ථාවරව පැවතුණි. රටවල් රාශියක පැවැති උචිත මෙන්ම දැඩි මූල්‍ය සහ බදු ප්‍රතිපත්ති වලින් අනුබල ලබමින් කාර්මික රටවල්, සංවර්ධනය වෙමින් පවතින රටවල් හා පරිවර්තනයට ලක්වෙමින් පවත්නා රටවල්වල උද්ධමනය අඩුවිය.

බොහෝ දියුණු වෙමින් පවතින රටවල ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ තවදුරටත් සිදුවූ අතර ඔවුන්ගේ වෙළඳ හා ගෙවීම් ක්‍රම නිදහස් කිරීම හේතු කොටගෙන මෙම කලාපය තුළට ගලා ආ ආයෝජන ප්‍රවාහය තවදුරටත් වර්ධනය විය. විශේෂයෙන්ම මෙක්සිකෝ වෙහි මූල්‍ය අර්බුදයේන් පසුව සහ ඇමරිකානු එක්සත් ජනපද හා ජපාන ආර්ථිකයන් යථා තත්ත්වයට පත්වීමක් පවතින තත්ත්වයන් යටතේ මෙය යහපත් වූ වර්ධනයකි. 1995 ජනවාරි මස ලෝක වෙළඳ සංවිධානය (ලෝ.වෙ.ස) පිහිටුවීමෙන් පසුව, එහි ප්‍රථම අන්තර් අමාත්‍ය රැස්වීම 1995 දෙසැම්බර් මස සිංගප්පූරුවෙහි දී පැවැත්විණි. මෙම රැස්වීමෙහි ප්‍රතිඵලයන් සතුටුදායක නොවේ යැයි සංවර්ධනය වෙමින් පවත්නා රටවල් විසින් සලකන ලදී. ඊට හේතු වූයේ එහි දී වැඩි කාලයක් සංවර්ධිත රටවල් විසින් පැන නැගූ නව ප්‍රශ්න සඳහා වැය කිරීම සහ න්‍යාය පත්‍රයෙහි ඇතුලත්ව තිබූ උරුගුවේ වටයෙහි (උ.ව.) අඩංගු ගිවිසුම් ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ප්‍රශ්න සඳහා වෙන් කරන ලද කාලය ප්‍රමාණවත් නොවීමය. මේ තත්ත්වය යටතේ මෙවැනි අහිතකර නැඹුරුවීම් වැළැක්වීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ආරම්භයේ දීම නොගතහොත් අනාගතයේ දී ලෝක වෙළෙඳ සංවිධානයේ කටයුතු වල දී සංවර්ධිත රටවල් විසින් ආධිපත්‍යයක් උසුලනු ඇත.

අයහපත් කාලගුණය සහ අභ්‍යන්තර ආරක්ෂක තත්ත්වය වැනි ජාත්‍යන්තර ආර්ථික වාතාවරණයකට සම්බන්ධ නොවූ හේතුන් නිසා 1996 වර්ෂයේ දී සැහෙන දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වූ ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාවලියට, ලෝකයේ සිදු වූ මෙම වර්ධනයන් සමස්තයක් වශයෙන් හිතකර විය.

විදේශීය අංශයේ වර්ධනයන්

1996 වර්ෂය තුළ දී විදේශීය අංශය දුෂ්කරතාවයන්ට සාර්ථක ලෙස මුහුණ දීමේ හැකියාව පෙන්නුම් කළේය. අපනයන සියයට 13 කින් වර්ධනය වූ අතර ආනයනය සියයට 7 කින් වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් වෙළඳ හිඟය 1995 දී රුපියල් දශ ලක්ෂ 77,435 ක් හෝ විගැහි දශ ලක්ෂ 997 (ද.දේ.නි යෙන් සියයට 11.6) සිට 1996 දී රුපියල් දශ ලක්ෂ 72,731 හෝ විගැහි දශ ලක්ෂ 909 (ද.දේ.නි. යෙන් සියයට 9.5) දක්වා අඩු විය. 1993 සිට අතිරික්තයක් පෙන්වූ සේවා ගිණුම 1996 දී රුපියල් දශ ලක්ෂ 5,427 (විගැහි දශ ලක්ෂ 68) හිඟයක් වාර්තා කරනු ලැබූ අතර මෙයට මූලික වශයෙන් සංචාරක ව්‍යාපාර වලින් ලැබීම් අඩුවීම හේතුවිය. පෞද්ගලික සංක්‍රාම සියයට 10 කින් වැඩි විය. මේ අනුව වෙළෙඳ, සේවා සහ සංක්‍රාමවල එකතුවක් වූ ගෙවුම් තුලනයේ ජංගම ගිණුම 1996 දී රුපියල් දශ ලක්ෂ 30,196 හෝ විගැහි දශ ලක්ෂ 378 (ද.දේ.නි. යෙන් සියයට 3.9) ක අඩු හිඟයක් පෙන්නුම් කළේය. පසුගිය වසරෙහි මෙම හිඟය රුපියල් දශ ලක්ෂ 32,957 හෝ විගැහි දශ ලක්ෂ 425 (ද.දේ.නි යෙන් සියයට 4.9) විය. ණය නොවන ප්‍රාග්ධන ගලාජම් ලෙස සලකනු ලබන පෞද්ගලිකකරණ ලැබීම් ඇතුලත් වූ සෘජු ආයෝජන, පසුගිය වර්ෂයෙහි පැවැති පසුබෑස්ම හා සසඳන විට 1996 රුපියල් දශ ලක්ෂ 6,606 (විගැහි දශ ලක්ෂ 83) ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය. කෙසේ වුව ද, ශුද්ධ

රූප සටහන 1.8

විදේශීය අංශයේ තෝරාගත් දර්ශක



නිල ප්‍රාග්ධන ලැබීම් සැලකිය යුතු අඩුවීමක් පෙන්විය. සමස්තයක් වශයෙන් ගෙවුම් තුලනයේ රුපියල් දශ ලක්ෂ 4,148 (විගැහි දශ ලක්ෂ 63 හිඟයක් පැවැති අතර එය නිල ප්‍රාග්ධන ගලාඒම් අඩුවීමෙහි ප්‍රතිඵලයක් විය.

ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවලින් වූ අඛණ්ඩ ඉහළ ඉල්ලුම හේතුවෙන්, තේ මිල ගණන් වැඩිවී තේ වගා අංශයට වාසිදායක තත්ත්වයක් ඇතිවිය. 1996 වසර තුළදී ලෝක තේ නිෂ්පාදනය සියයට 4 කින් පමණ වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල තේ සඳහා වූ ඉල්ලුම සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. ප්‍රධාන වශයෙන්ම තේ සහ පොල් නිෂ්පාදනවල මිල ඉහළයාම හේතුවෙන් වෙළෙඳ අනුපාතය සියයට 2 ක වර්ධනයක් පෙන්නුම් කළේය. කාර්මික අපනයන ක්ෂේත්‍රයේ දී, බටහිර කාර්මික රටවල ආර්ථික වර්ධනය යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලියෙන් සම්පූර්ණ වාසි ලබා ගැනීමට ශ්‍රී ලංකාවට නොහැකි වුයේ 1996 වසර තුළදී තාවකාලිකව මුහුණ පෑමට සිදු වූ සැපයුම් අඩාලවීම නිසා ය. දේශීය නිෂ්පාදනය පහත වැටීම නිසා ඇති වූ අඩුව පිරවීම සඳහා අතිරේක ආහාර ආනයන, විශේෂයෙන්ම සහල් ආනයනය කිරීමට සිදු විය. තාප බලය නිපදවීම සඳහා ඩීසල් සහ දැවිතෙල් සඳහා වූ අධික ඉල්ලුම සපුරාලීමට විශාල වශයෙන් ඛණිජ තෙල් ආනයනය වැඩි කිරීමට සිදුවිය.

1996 වසර සඳහා විදුලි උත්පාදන යන්ත්‍ර ආනයනය පිරිවැය විගැහි දශ ලක්ෂ 43 ක් පමණ වේ යැයි ඇස්තමේන්තු කර ඇත. 1995 දී එයාර් ලංකා ආයතනය විසින් ආනයනය කළ ගුවන් යානයට සහ 1996 වර්ෂයේ ආනයනය කළ විදුලි උත්පාදන යන්ත්‍රවල වටිනාකමට ගැලපීමෙන් පසු 1996 වර්ෂයේ ආයෝජන භාණ්ඩ ආනයනය සියයට 10 කින් වර්ධනය විය.

පෞද්ගලීකකරණ වැඩපිළිවෙලෙහි අඩු ප්‍රගතියක් තිබියදී ද, 1996 වර්ෂය තුළ දී පසුගිය වසරෙහි දී මෙන් ම පෞද්ගලීකකරණය ලැබීම් වශයෙන් විගැහි දශ ලක්ෂ 23 ක ගලාඒමක් පැවතුණි. දිගුකාලීන පෞද්ගලික ශුද්ධ ණය ප්‍රාග්ධන, විගැහි දශ ලක්ෂ 49 සිට විගැහි දශ ලක්ෂ 2 දක්වා විශාල වශයෙන් පහත වැටුන අතර, මෙයට මූලික වශයෙන් හේතු වූයේ එයාර් ලංකා සමාගම, එහි ප්‍රතිසම්පාදන වැඩපිළිවෙල යටතේ කලින් ලබාගත් ණය ආපසු ගෙවීම් වැඩිවීම සහ අළුතින් ණය ලබා නොගැනීමත්, ආයෝජන මණ්ඩලය යටතේ පැවැති ව්‍යවසායයන් මගින් විදේශීය ණය ලබා ගැනීම් වශයෙන් වූ ශුද්ධ ගලා ඒම් අඩුවීමත් ය. 1996 වර්ෂය තුළ ශුද්ධ නිල ප්‍රාග්ධන ගලා ඒම් ද අඩු විය.

මහ බැංකුව විනිමය වෙළෙඳපලෙහි මැදිහත්වීම සඳහා භාවිතා

කරන ඇ.එ.ජ. ඩොලරයෙහි දිනපතා මිලදී ගැණුම් සහ විකිණීම් අනුපාතිකයන් සියයට 2 ක පරාසයක් තුළ පවත්වාගෙන ගියේ ය. දේශීය විනිමය වෙළඳපල නිදහස්ව පැවැති අතර, වාණිජ බැංකුවලට නිදහසේ ඔවුන්ගේ මිල දී ගැණුම් සහ විකුණුම් අනුපාතිකයන් තීරණය කළ හැකි විය. වාණිජ බැංකු, අන්තර් බැංකු වෙළඳපල තුළ මිලදී ගැනීම් මගින් ඔවුන්ගේ ශුද්ධ විදේශ විනිමය ශේෂයන් පවත්වා ගෙන යාමට උත්සාහ කරනවා වෙනුවට, ඔවුන්ගේ ශුද්ධ විදේශීය වත්කම් කිසියම් ප්‍රමාණයකින් අඩුවීමට ඉඩ සලසමින් විනිමය වෙළඳපලෙහි පීඩනයෙන් කොටසක් උකහා ගැනීමට දැක් වූ කැමැත්ත නිසා රුපියල් සහ ඇ.එ. ජ. ඩොලර් අනුපාතිකය ප්‍රධාන වශයෙන් වෙළඳපල උපනතිය පිළිබිඹු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිත තත්ත්වය ද සතුටුදායක තත්ත්වයක පැවති අතර සංචිත ආරක්‍ෂා කර ගැනීමට අවශ්‍යයෙන්ම මැදිහත්වීමට මහ බැංකුවට සිදු නොවීය. වැඩි වශයෙන්ම සාර්ව ආර්ථික අසමතුලිතතාවයෙහි ප්‍රතිඵලයක් නොවූ එහෙත් විශාල වශයෙන් තාවකාලික සැපයුම් අඩාලවීම හා සම්බන්ධ අස්ථිර තත්ත්වයක ප්‍රතිඵලයක් වූ 1996 වර්ෂය තුළ පැවැති අධික උද්ධමනකාරී තත්ත්වයට එරෙහිව සඵල නාමික ප්‍රතිපත්ති උපකරණයක් වශයෙන් විනිමය අනුපාතිකය පිළිබඳ මෙම ප්‍රතිපත්තිය වාණිජ බැංකු මෙන්ම මහ බැංකුව ද භාවිතා කරනු ලැබීය.

ආහාර ද්‍රව්‍ය මිල ඉහළ යාමේ ගැටළුවෙන් මිදීමට සහනයක් වශයෙන් 1996 අප්‍රේල් 15 දින සිට මාස $8^1/_2$ ක කාල පරිච්ඡේදයක් වෙනුවෙන් සහල් ආනයනය සඳහා පූර්ණ බදු අත්හැරීමක් (සියයට 35 ක) සිදු කරන ලදී. 1996 ජූනි 1 දින සිට මාස 7 ක කාල පරිච්ඡේදයක් සඳහා පූර්ණ බදු අත්හැරීමක් (සියයට 10 ක) ලබා දීමෙන් විදුලි ජනක උත්පාදන යන්ත්‍ර ආනයනය දිරිගන්වන ලදී. පොල් මද නිෂ්පාදනවල අන්තර් ජාතික මිල ඉහළ යාමේ තත්ත්වය යටතේ දේශීය කර්මාන්තවලට අතදීමක් වශයෙන් සහ ආහාරයට ගන්නා තෙල් වර්ගවල මිල අඩුකිරීම සඳහා කොප්පරා සහ ආහාරයට ගන්නා තෙල් වර්ග සඳහා සියයට 30 ක බදු අත්හැරීමක් 1996 ජූනි 12 දින සිට මාස 7 ක කාලපරිච්ඡේදයක් සඳහා ලබා දෙන ලදී. රෙදිපිළි, ඉස්සන් සහ කෑම පිණිස කුකුළන් ඇති කරන දේශීය නිෂ්පාදකයන්ට සහන සැලසීමේ පියවරක් වශයෙන් නූල්, ඉස්සන් හා කුකුල් කෑම සඳහා බදු අත්හැරීමක් ප්‍රදානය කරන ලදී.

සුළු හා මධ්‍යම පරිමාණයේ අපනයනකරුවන්ට ඔවුන්ගේ ආයෝජනවල ඵලදායීතාව වැඩිකර ගැනීමටත්, ජාත්‍යන්තර වෙළඳපොලේ තරගකාරී බව වැඩි දියුණු කර ගැනීමටත් අවස්ථාව සැලසෙන පරිදි ප්‍රාග්ධන භාණ්ඩ හා අන්තර් භාණ්ඩ බදු වලින් නිදහස් කිරීමේ ක්‍රමය යටතේ, තම නිෂ්පාදනයෙන් සියයට 90 කට වඩා අපනයනය කරනු ලබන අපනයනකරුවන්ට පමණක් මෙතෙක් හිමිව තිබූ සියයට 100 ක තීරුබදු සහ අනෙකුත් බදු නිදහස් කිරීම්, සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන්ට ලබා දීමට යෝජනා කරන ලදී. මෙම ක්‍රමය යටතේ සිය නිෂ්පාදිතයෙන් සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක් අපනයනය කරනු ලබන අපනයනකරුවන් ආනයනයකරනු ලබන ප්‍රාග්ධන හා අන්තර් භාණ්ඩ, තීරුබදු හා අනෙකුත් බදු වලින් සියයට 100 කින් නිදහස් කිරීමටත්, තම නිෂ්පාදිතවලින් සියයට 25 ත් 50 ත් අතර අපනයනය කරනු ලබන අයට සියයට 50 ත් බදු සහන ලබාදීමටත් යෝජනා කරන ලදී.

1997 අයවැය ලේඛනය මගින් නිවේදනය කළ පොලී අනුපාතික අඩු කිරීමත්, පෞද්ගලික අංශයට වැඩි අරමුදල් ප්‍රමාණයක් ලබාදීමත් අරමුණු කරගෙන, මහ බැංකුව මගින් වාණිජ බැංකුවලට, ඔවුන්ගේ විදේශ මුදල්

රූප සටහන 1.9
දෛනික විනිමය අනුපාතික
(එ.ජ.ඩො / ශ්‍රී. ලං.රුපියල්)



බැංකු ඒකකවල සහ දේශීය බැංකු ඒකකයන්හි තිබෙන අරමුදල් වලින්, කාරක ප්‍රාග්ධන සහ ස්ථාවර ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් ප්‍රමාණවත් විදේශ මුදල් ප්‍රමාණයක් තිබෙන අපනයනකරුවන් හට, විදේශ මුදල් වලින් ණය ලබා දීමට අවසර දීම සඳහා යෝජනා ක්‍රමයක් ඇති කරනු ලැබීය. විනිමය පාලක විසින් අනුමත කරන ලද අපනයනකරුවන්ට අවශ්‍ය උපාංග සපයනු ලබන්නන් හට ද, ඔවුන්ගේ ආනයන අවශ්‍යතා මූල්‍යකරණය කිරීමට විදේශ ණය මුදල් ලබා ගැනීමට හැකිවේ. 1997 ජනවාරි 3 දින වාණිජ බැංකුවලට මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීමත් සමගම මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක විය.

1996 වර්ෂය තුළ රටෙහි විදේශ වත්කම් විගැහි දශ ලක්‍ෂ 28 කින් අඩු විය. දෙසැම්බර් මාසය අගදී පැවැති විගැහි දශ ලක්‍ෂ 1,701 ක් වූ දළ විදේශ වත්කම් ප්‍රමාණය 1997 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද මාස 5 ක පමණ ආනයන මූල්‍යකරණය කිරීමට ප්‍රමාණවත් විය. භාණ්ඩ, සේවා සහ පෞද්ගලික සංක්‍රාමවල අනුපාතයක් වශයෙන්. ණය සේවා ගෙවීම් 1995 දී සියයට 11.9 සිට 1996 දී සියයට 13 දක්වා වැඩිවිය.

මේ අතර, තිව්‍ර කරන ලද ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම්වල දෙවැනි පියවර 1997 දී සකස් කිරීම සඳහා අවශ්‍ය පදනමක් දැමීමට, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයන් සඳහා අදාළ අංශ පිළිබඳව එකග වනු පිණිස වර්ෂය තුළ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සහ ලෝක බැංකුව සමග මූලික සාකච්ඡා පවත්වනු ලැබීය.

සංචාරක කර්මාන්තය

1996 ජනවාරි මාසයේ දී කොළඹ සිදුවූ බෝම්බ ප්‍රහාරය නිසා දැඩි පිරිහීමකට ලක්වූ සංචාරක කර්මාන්තය වර්ෂය අවසානය වන විට, යෙමින් යථා තත්ත්වයට පත්වෙමින් පැවතිණ. කෙසේ වුව ද, 1996 වර්ෂයේ දී සංචාරකයින්ගේ පැමිණීම 302,265 ක්ව සියයට 25 කින් පහත වැටුණි. මේ හේතුවෙන් 1995 දී විගැහි දශ ලක්‍ෂ 149 (රුපියල් දශ ලක්‍ෂ 11,569) ක් වූ සංචාරක කර්මාන්තයේ දළ ඉපැයීම්, 1996 දී විගැහි දශ ලක්‍ෂ 115 (රුපියල් දශ ලක්‍ෂ 9,195) ක් දක්වා සියයට 23 කින් පහත වැටුණි. සංචාරකයන්ගේ පැමිණීම් 1996 දෙසැම්බර් මස සියයට 12 කින් ඉහළ නැගුණි.

1.5 මූල්‍ය අංශයේ සංවර්ධනයන්

මුදල් සැපයුම

ආර්ථික කටයුතු වල වර්ධනය පහත වැටීමත්, නියගය හා විදුලි බලය කපා හැරි කාලය තුළ බැංකු විසින් තම ණය දීම් කෙරෙහි වැඩි පරීක්ෂාකාරීත්වයකින් කටයුතු කිරීමත්, දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය හා අක්‍රිය ණය වැඩිවීම නිසා බැංකු මුහුණ දුන් ද්‍රවශීලතාවය පිළිබඳ සීමාවන් නිසාත්, මූල්‍ය වර්ධනයේ සැලකියයුතු අඩුවීමක් දක්නට ලැබිණ. රජයේ ණය අවශ්‍යතාවයන්ගේ ඉහළයෑම පිළිබිඹු කරමින් මහ බැංකුව විසින් රජය

රූප සටහන 1.10

මූල්‍ය සමස්ථයන්





වෙත සපයන ලද ණය ප්‍රමාණයේ ශීඝ්‍ර වර්ධනයක් විය. වසරේ දෙවන භාගයේ දී පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණයෙහි වර්ධනය තියුණු ලෙස පහත වැටුණි. ලක්ෂමය පදනමක් මත 1995 වසර අවසන් වන විට සියයට 19.2 ක් වූ පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය 1996 වසර අවසන් වන විට සියයට 10.8 කට අඩු විය. පුළුල් මුදල් සැපයුම හා සසඳන විට, පටු මුදල් සැපයුම පෙර වර්ෂයේ දී මෙන් සියයට 4 ක පමණ වූ අඩු වේගයකින් වර්ධනය වී ඇත. ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර, ණය පත් සහ විද්‍යුත් බැංකුකරණය වැනි ආරුඪ මුදල්හි ද්‍රවශීලතාවය වැඩි කරන නවීන බැංකු පහසුකම් සහ ඉහළ පොලී අනුපාතික පවතින වාතාවරණයක් තුළ මහජනයා ගණුදෙනු ශේෂයන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්වීම පටු මුදල් සැපයුමේ අඩු වර්ධනයට හේතු වී ඇත. පසුගිය වසරේ අවසානයේදී අධි ණය වර්ධනය හේතුකොට ගෙන පැන නැගුණු අධි ද්‍රවශීලතා තත්ත්වය (පවත්නා මිල යටතේ දළ ජාතික නිෂ්පාදනයේ වර්ධන වේගයට වඩා වැඩි වූ මුදල් සැපයුමේ වර්ධනය) 1996 වසරේ දෙවන භාගයේ දී ක්‍රමයෙන් අඩුවී ගියේ ය.

මූලිකවම, පෞද්ගලික අංශයේ ණය වර්ධනය අඩුවීම පිළිබිඹු කරමින්, 1995 වසරේ දී සිදු වූ සියයට 27.4 ක තියුණු වර්ධනයට සාපේක්ෂව, 1996 වසරේ දී බැංකු අංශයේ ශුද්ධ දේශීය වත්කම් සියයට 18.1 කින් වැඩි විය. 1995 වර්ෂයේ දී ඇති වූ සියයට 28.2 ක වර්ධනයට සාපේක්ෂව පෞද්ගලික අංශයට දුන් බැංකු ණය සියයට 14.7 කින් වැඩි විය. ආරක්ෂක කටයුතු හා තිරිඟු පිටි සහනාධාර සඳහා වියදම් වැඩිවීමත් පෞද්ගලිකරණයෙන් ලත් ආදායම අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩුවීම නිසා ඇති වූ රජයේ ආදායම පහත වැටීමත් හේතුකොට, ගෙන රජයට වැඩි බැංකු ණය ප්‍රමාණයක් ලබා ගැනීමට සිදු විය. මූල්‍ය අවශ්‍යතාවන් වැඩි වුව ද රජය විසින් දැනට පවතින භාණ්ඩාගාර බිල්පත්වල නොපියවූ මට්ටමක වූ රුපියල් දශ ලක්ෂ 125,000ක සීමාව වැඩි නොකරන ලදී. මෙම සීමාව වැඩි නොකිරීමත්, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය වඩා කාර්යක්ෂම වීමත්, පරිපාලන මිල ගණන්හි ගැලපුම් කිරීමත් නිසා අයවැය හිගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් කල පෙර වර්ෂයට වඩා පහළ මට්ටමක පවත්වා ගැනීමට හැකි විය. එසේ වුව ද, 1995 වසරේ රජයට බැංකු අංශය මගින් දුන් ශුද්ධ ණය ප්‍රමාණය වූ දශ ලක්ෂ 7,067 ට සාපේක්ෂව, 1996 වසරේ එම ණය දශ ලක්ෂ 12,344 කින් වැඩි විය. මෙම වැඩි වීමෙන් දශ ලක්ෂ 9,873 ක් මහ බැංකුවෙන් ලැබිණ. බැංකු ක්‍රමයෙන් අය වැය හිගය මූල්‍යකරණය කිරීම මෙවැනි මට්ටමක තිබුණත්, විශේෂයෙන්ම 1996 මැද කාලයේ දී පැවැති පසුබෑස්මේ සිට ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත්වීමේ වාතාවරණයක් තුළ, මූල්‍ය තත්ත්වයන්හි දැඩි සීමාකාරී තත්ත්වයක් දක්නට විය. මෙහිලා අවශ්‍ය වූ මූල්‍ය ප්‍රතිපත්තියෙහි යම් ලිහිල් කිරීමක් 1997 මුල් භාගයේ දී සිදු කෙරිණි.

පිළිවෙලින් දෙවන වසරටත් ඇති වූ ගෙවුම් තුලනයේ හිගය අනුව, බැංකු අංශයේ ශුද්ධ විදේශ වත්කම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4,671 කින් පහත වැටුණි. මෙම සමස්ත අඩුවීමෙහි ප්‍රධාන කොටස වූයේ රුපියල් දශ ලක්ෂ 4,156 කින් පහත වැටුන වාණිජ බැංකු ශුද්ධ වත්කම් ප්‍රමාණයයි. ශුද්ධ වත්කම් අඩුවීම විදේශ විනිමය වෙළෙඳපොළ කෙරෙහි තරමක් දුරට පීඩනයක් ඇති කළ අතර, 1996 වසරේදී ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය සියයට 5 කින් අවප්‍රමාණය විය.

සංචිත මුදල් ප්‍රමාණයේ (අධි බලැති මුදල් හෝ මූල්‍ය පදනම) 1995 වසරේ දක්නට ලැබුණු රුපියල් දශ ලක්ෂ 10,532 හෝ සියයට 15.5 ක වර්ධනයට සාපේක්ෂව, 1996 වසරේ දී රුපියල් දශ ලක්ෂ 6,922 කින් හෝ සියයට 8.8 කින් වැඩි විය. බැංකු පද්ධතියේ ශුද්ධ දේශීය වත්කම් හි සිදු වූ සියයට 18 ක සමස්ත වර්ධනය ගමුවේ, සංචිත මුදල් ප්‍රමාණයේ ඇති වූ මෙම අඩු වර්ධනය, ද්‍රවශීලතාවයේ සැලකිය යුතු අඩුවීමක් පෙන්විය. ද්‍රවශීලතාවයේ මෙම අඩුවීම, පුළුල් මුදල් ගුණකයේ අගය යම් ප්‍රමාණයකින් ඉහළයාම මගින් නිරූපණය වූ අතර, වසරේ දෙවන භාගය තුළ ගුණකයේ අගය ආසන්න වශයෙන් 3 ක් පමණ විය.

මූල්‍ය ප්‍රතිපත්තිය

1996 වසරේ මැද භාගයේ දී පැවැති තාවකාලික මන්දගාමී ආර්ථික වාතාවරණයක් තුළ මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමට මහ බැංකුවට සිදු විය.



බලශක්ති අර්බුදය හේතුවෙන් අපහසුතාවයනට පත් ආයතන මගින් සහන ණය පහසුකම් සඳහා ඉහළ ඉල්ලුමක් ඇති කරන ලදී. එසේම පසුගිය වසරේ සිට පැවත ආ සැලකිය යුතු අධි ද්‍රවශීලතායක් ද පැවතිණ. මහ බැංකුව තවදුරටත් මිල ස්ථායීකරණ අරමුණු කෙරෙහි ප්‍රමුඛ තැන ලබා දුනි. මෙවැනි වාතාවරණයක් තුළ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතාවයන් අඩු කිරීමට, අයවැය හිගය අඩු කිරීම සඳහා තිරිඟු පිටි, පාන් සහ ඛණිජ තෙල් පරිපාලන මිල ගණන් ඉහළ දැමීම මෙන්ම, ප්‍රමුඛ නොවන වියදම් අඩු කිරීමට පියවර ගැනීමද හේතු විය. නියගය හා බලශක්ති අර්බුදය නිසා ඇති වූ භාණ්ඩ සැපයුමෙහි තාවකාලික අපහසුතාවන් නිසා මිල ගණන් වැඩිවිය. වසරේ මුල් කාර්තු තුන තුළ ඉහළ මූල්‍ය ප්‍රසාරණයක් පැවතිම නිසා (පුළුල් මුදල් සැපයුම සම්බන්ධයෙන් එය සියයට 20 කට වඩා අධික විය) සහ මිල ගණන් ඉහළ යාම නිසා, උද්ධමන පීඩනය අඩුවන තුරු, මූල්‍ය පාලනය ලිහිල් කිරීම යෝග්‍ය නොවිය.

ඉහළ ව්‍යවස්ථාපිත සංචිත තවදුරටත් බලපැවැත්වුනු අතර, අවදානම් සහිත ණය හා පාරිභෝජන කටයුතු සඳහා දෙනු ලබන ණය ප්‍රමාණයන් අඩු කිරීමට වාණිජ බැංකු යොමු කරවීමට ශිෂ්ට ප්‍රයෝග යොද ගැනිණ. මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාවය සුරැකීම සඳහා හිතකර බැංකු පරිචයන් පවත්වාගෙන යාමෙහි වැදගත්කම වාණිජ බැංකු කළමනාකරුවන් සමග සෑම මසකම පවත්වන රැස්වීම්වල දී මහ බැංකුව විසින් අවධාරණය කරන ලදී. විවට වෙළෙඳ කටයුතු මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන උපකරණය ලෙස අඛණ්ඩව යොද ගැනිණ. 1996 මැද භාගයේදී ද්‍රවශීලතා හිගයකට මුහුණ දුන් ආයතනයන් විසින් සහන ණය සඳහා කරනු ලැබූ ඉල්ලුම වැඩිවූ විට, අවශ්‍ය පරිදි ණය ප්‍රතිව්‍යුහගත කිරීමකින් අනතුරුව තම ගණුදෙනුකරුවන්ගේ ණය අවශ්‍යතා එකිනෙක වෙන වෙනම සලකා බලා තාවකාලික ණය අවශ්‍යතා සපුරාලීම සඳහා බැංකු පෙළඹවීමට මහ බැංකුව විසින් ශිෂ්ට ප්‍රයෝග උපයෝගී කර ගන්නා ලදී.

රජයේ වියදම් වැඩිවීමත්, පුද්ගලිකරණයෙන් ලත් අරමුදල් ප්‍රමාණයෙහි හිගයක් ඇතිවීමත් සමග රජයේ මූල්‍යකරණ අවශ්‍යතාවයන්හි කොටසක් සැපයීමට මහ බැංකුවට සිදුවීම නිසා, දෙසැම්බර් මස අවසන් වන විට රජයට දුන් ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 9,873 කින් වැඩිවී තිබුණි. නොපියවූ භාණ්ඩාගාර බිල්පත් වල වටිනාකම පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද රුපියල් දශ ලක්ෂ 125,000 සීමාව කරා ළඟාවීම හේතුකොට ගෙන, 1996 වසරේ ඔක්තෝබර් මසට පසු භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමෙන් රජය සෘජු ලෙස ණය ලබා ගැනීම සීමා විය. අඩු ඵලදායිතාවයක් ඇති වියදම් අඩු කිරීමට සහ අයවැය හිගය සීමා කිරීමට උපකාරී වෙමෙන්, භාණ්ඩාගාර බිල්පත් නිකුතුව සඳහා වූ මෙම සීමාව රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ යම් විනයක් ඇති කළේ ය. එයට අමතරව 1995 වසරේ පැවැති පොලී අනුපාතික මට්ටම්වලට වඩා පහත් මට්ටමක 1996 වසරේ භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයන් දිගින් දිගට පවත්වාගෙන යෑමට තුඩු දුන් එක් සාධකයක් වූයේ මෙම සීමාවය. රජයේ මූල්‍යකරණ අවශ්‍යතාවන්හි කොටසක් සපුරන ලද්දේ පරිපාලන ණය ගැනීම් එනම් ඇතැම් රජයේ ආයතන වෙත තිබූ අතිරික්ත මුදල් ප්‍රමාණයන් සෘජු ලෙස ලබාගැනීම මගිනි.

වසර පුරා විවට වෙළඳපොල කටයුතු පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයක් මහ බැංකුව වෙත තිබුණි. මහ බැංකුව විසින් මුදල් වෙළෙඳපොලෙහි ක්‍රියාකාරීත්වය පරීක්ෂා කර ඒකෂණ මුදල් පොලී අනුපාතිකයන්හි උච්චාවචන අඩුකිරීමේ අරමුණින් ප්‍රතිවිකුණුම් ගණුදෙනු සඳහා සහ ද්විතියික වෙළෙඳ පොලේ ගණුදෙනු සඳහා අදාළ පොලී අනුපාතිකයන්හි ගැලපීම් ඇති කරන ලදී. මූල්‍ය පාලන අරමුණු සඳහා ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය එතෙර ආයෝජනය කළ විදේශ මුදල් තැන්පතු හැර අන් සියළුම තැන්පතු සඳහා සියයට 15 ක් ලෙස පවත්වා ගෙන යන ලදී. එතෙර ආයෝජනය කළ විදේශ මුදල් තැන්පතු සඳහා මෙම සංචිත අනුපාතය සියයට 5 ක අඩු මට්ටමක පැවතුණි.

වසරේ අවසාන කොටසේ මුදල් සැපයුමේ වර්ධනය අඩුවීමත්, මිල මට්ටම්වල ඉහළ යාම ක්‍රමයෙන් පහත වැටීමත් සමග මූල්‍ය වෙළෙඳපොල හා විනිමය වෙළෙඳපොල වඩා ස්ථායී විය. කෙටිකාලීන පොලී අනුපාතිකයන්හි උච්චාවචන සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවිය. කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතු මාර්ගයෙන් බැංකු විසින් රැස්කරනු ලැබූ තැන්පතු සියයට 15 කින් වැඩි විය. නේවාසික නොවන විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු සියයට 16 කින් වැඩි විය. වසරේ අවසාන භාගයේ දී ආර්ථිකය ඉක්මනින් යථා තත්වයට පත්වෙමින් පැවැති නිසාත්, උද්ධමන පීඩනය සැලකිය යුතු තරම් අඩුවී තිබූ නිසා, මහ බැංකුව විසින් මූල්‍ය ප්‍රතිපත්තිය යෝග්‍ය පරිදි ලිහිල් කිරීමක් පිළිබඳව සලකා බලමින් සිටියේ ය. මෙම සලකා බලමින් පැවැති ලිහිල් කිරීම තුළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයේ අඩුකිරීමක් හා ආයෝජන මණ්ඩලය යටතට නොගැනෙන අපනයනකරුවන්ට විදේශ ව්‍යවහාර මුදල් ණය ලබා ගැනීමට අවසර දීම අඩංගු විය. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය යෝග්‍ය මට්ටමකට ක්‍රමිකව පහත හෙලීම මගින් මුදල් සැපයුම විධිමත් කිරීම සඳහා විවට වෙළෙඳ පොල කටයුතු වැනි වෙළෙඳපොලමය මැදිහත්වීම් වෙත නැඹුරු වීමට මහ බැංකුවට හැකි වෙනැයි අපේක්ෂා කෙරිණ.

පොලී අනුපාතික

පොලී අනුපාතික 1996 වර්ෂයේ දී, 1995 වසරට වඩා සාමාන්‍ය වශයෙන් පහත මට්ටමක පැවැති අතර බෙහෙවින් අඩු උච්චාවචනයන් පෙන්විය. රජයේ කටයුතු සහ ශුද්ධ විදේශ වත්කම් ගලාඒම හේතුකොට ගෙන, වෙළෙඳ පොලට ද්‍රවශීලතාවය එක්වීමත් සමග, 1996 මුල් කාලයෙහි කෙටිකාලීන පොලී අනුපාතික තියුණු ලෙස පහත වැටුණි. ඉන්පසුව ණය සඳහා රජයේ ඉල්ලුම වැඩිවීම සහ ගෙවුම් තුලන හිගයක් ඇතිවීමත් සමග, නොවැම්බර් මස මැද වනතුරු පොලී අනුපාතික ක්‍රමයෙන් ඉහළ නැගුණි. වසර අවසානයේදී නැවතත් පොලී අනුපාතික පහත වැටීමක් දක්නට

රූප සටහන 1.12

පොලී අනුපාත





ලැබුණ. මධ්‍ය සහ දීර්ඝකාලීන පොලී අනුපාතිකයන් ද වර්ෂය තුළ දී සාපේක්ෂ වශයෙන් ස්ථායීව පැවතුණි.

වාණිජ බැංකු කටයුතු

කෘෂිකාර්මික හා කර්මාන්ත නිෂ්පාදන හා සංචාරක ව්‍යාපාරයේ තාවකාලික පහත වැටීමත්, අක්‍රිය ණය ඉහළ යාමත්, අනාරක්ෂිත වාතාවරණය හේතුකොට ගෙන පැවැති අවිනිශ්චිතභාවය නියා වාණිජ බැංකු සිය ණයදීම් වලදී වැඩි පරීක්ෂාකාරීත්වයක් දක්වා ඔවුහු සිය වත්කම් වලින් වැඩි කොටසක් භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ සුරැකුම්පත් (අදාළ වර්ෂය තුළ මෙහි සියයට 34 ක වර්ධනයක් පෙන්විය) වැනි අඩු අවදානම් වත්කම්වල යෙදවීමට පියවරගෙන තිබූ අතර ඇයිරා මත ණයදීම් බොහෝ දුරට නොවෙනස්ව පවත්වා ගෙන ගොස් තිබුණි. (මෙහි වර්ධනය සියයට 2 ක් පමණි.)

1996 මැද භාගයේදී ආර්ථික කටයුතු තුල වූ පසුබෑස්මත් සමග ණය සහ අත්තිකාරම් හි වර්ධනය අඩුවූ අතර, වාණිජ බැංකුවල මුළු වත්කම් කලින් වර්ෂයේ සියයට 19 ක වැඩිවීම හා සසඳා බලන විට 1996 දී සියයට 16.2 කින් වැඩිවිය.

වගකීම් අංශයෙහි, තැන්පතු වගකීම්, දේශීය අන්තර් බැංකු ණය ගැනීම්, ගෙවා නිමි ප්‍රාග්ධනය, සංචිත සහ නොබෙදූ ලාභ සහ අනෙකුත් වගකීම්වල ප්‍රධාන වර්ධනයන් දක්නට විය. ඉල්ලුම් තැන්පතු සහ කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතු පිළිවෙලින් සියයට 14.8 කින් (රුපියල් දශ ලක්ෂ 6,291) සහ සියයට 14.7 කින් (රුපියල් දශ ලක්ෂ 27,384) වැඩිවීම හේතු කොටගෙන 1996 දී මුළු තැන්පතු සියයට 14.8 කින් (රුපියල් දශ ලක්ෂ 33,675) ඉහළ ගියේ ය. ආදායම් වර්ධනය අඩුවීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් තැන්පතු රැස් කිරීමෙහි සුළු අඩුවීමක් පෙන්නුම් කරමින් මුළු තැන්පතු, මුළු සම්පත් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 1995 දී සියයට 69 සිට 1996 දී සියයට 67 දක්වා අඩුවිය. 1995 සමග සසඳන කල ඒකෂණ මුදල වෙළෙඳපොලේ පැවැති අඩු පොලී අනුපාතිකය හේතුකොට ගෙන, බැංකු තම කෙටිකාලීන මුදල් අවශ්‍යතාවයන් සඳහා විදේශ ණය ගැනීම් වලට වඩා දේශීය අන්තර් බැංකු වෙළෙඳපොළ කෙරෙහි වැඩි විශ්වාසයක් තැබිය. අදාළ වර්ෂය තුළ දී, දේශීය අන්තර් බැංකු ණය ගැනීම් සියයට 83.8 කින් වැඩි වූ අතර, විදේශ ණය ගැනීම් සියයට 28.6 කින් අඩු විය.

1.6 ප්‍රශ්න සහ ගැටළු

ශ්‍රී ලංකා ආර්ථිකය 1970 දශකයේ අග භාගයේ දී නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වාදීමේ සිට විවිධ වෙනස්කම් වලට භාජනය විය. අපනයන ව්‍යුහය, ප්‍රාථමික කෘෂිකාර්මික අපනයනයන් මත දරණ රැඳියාව දැනට අඩු වී ඇති අතර, එය දේශීය සහ විදේශීය බාහිර බලවේගවලට ගොදුරු වීමට ඇති ඉඩකඩ ද අඩු වී ඇත. නව නිමැවුම් සහ සේවා කටයුතු ජනිත වී ඇති අතර, විදේශ රැකියා ඇතුළුව සේවා නියුක්ති අවස්ථාවන් විශාල වශයෙන් උත්පාදනය වී ඇත. බැංකු සහ මුල්‍ය ක්‍රමය ද සැලකිය යුතු පරිදි වැඩි දියුණු වීමකට සහ පුළුල් වීමකට ලක් විය. කෙසේ වෙතත්, ආර්ථික වර්ධන වේගය ඉහළ නංවා ගැනීමට නම් සමහර අංශවල ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ තවදුරටත් සිදු කිරීම අවශ්‍යය. මූලික අවධානයට යොමු විය යුතු එවැනි අංශ කිහියක් පහත දක්වා ඇත.

වැවිලි නොවන කෘෂිකාර්මික අංශය තවදුරටත් ගතික තත්ත්වයට පත් කළ යුතු ය. ඵලදායීතාවය ඉහළ නැංවෙන නව තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම, මෙම අංශය වඩාත් වෙළෙඳ පොල වෙතට නැඹුරු කිරීම සහ පෞද්ගලික අංශයට වඩාත් කාර්යක්ෂම ලෙස හැසිරවිය හැකි කෘෂි නිෂ්පාදන මිල දී ගැනීමේ හා බෙද ගැරීමේ කටයුතුවල රාජ්‍ය අංශයේ මැදිහත්වීම ඉවත් කිරීම තුළින් ගොවීන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවිය හැකිය. මෙම අංශය හා සම්බන්ධ රජයේ කාර්යභාරය විය යුත්තේ කෘෂිකාර්මික වෙළෙඳපොලවල් සංවර්ධනය කිරීම සඳහා පෞද්ගලික අංශය වඩාත් ඵලදායී ලෙස සහභාගි කර ගැනීම පිණිස වඩාත් පැහැදිලි සහ තිරසාර කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් නිෂ්පාදන සහ සාධක වෙළෙඳ පොලවල් වල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමය. මිරිස් සහ ළූණු ආනයනය කිරීම සඳහා අවශ්‍ය වූ බලපත්‍ර ක්‍රමය ඉවත් කිරීම නිවැරදි පියවරකි. මේ සම්බන්ධයෙන් සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ (සතොස) සහ වී අලෙවි මණ්ඩලය වැනි රාජ්‍ය ආයතනවල කටයුතු නිසා සිදුවන වෙළෙඳපොල විකෘතිතා ඉවත් කළ යුතු වේ.

ආහාර සුරක්ෂිතභාවය, මිල ස්ථාවරත්වය, අතරමැදියන්ගෙන් නිෂ්පාදකයන් මෙන්ම පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ සාධාරණ තරගකාරීත්වයක් ඇති කිරීම යන අවශ්‍යතා මත රාජ්‍ය වෙළෙඳ සංවිධාන පැවැතීම බොහෝවිට සාධාරණීකරණය කර ඇත. මේ හා සම්බන්ධ උපකල්පනය වන්නේ ඉහත අවශ්‍යතාවයන් කාර්යක්ෂමව ඉටු කිරීමට

වෙළෙඳපොල ක්‍රමය අපොහොසත්වේය යන්න සාධාරණීකරණය කිරීමට අපහසු තර්කයකි. ප්‍රචලිත සංකල්පයක් වන 'වෙළෙඳපොල අසාර්ථකවීම' අදාළ වන්නේ ස්වාභාවික සම්පත් පරිසරයට ඔරොත්තු නොදෙන ලෙස අධික වශයෙන් ප්‍රයෝජනයට ගැනීම, නොසැලකිලිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම, මාර්ග ආලෝකය වැනි පොදු භාණ්ඩ හා සම්බන්ධ නොවැළැක්විය හැකි ලෙස භාණ්ඩ නොමිලේ පරිභෝජනය කිරීමට පෙළෙඹීම වැනි බාහිරතා පවතින අවස්ථා සඳහා ය. රාජ්‍ය මැදිහත්වීමක් නොමැති, තරගකාරී වෙළෙඳපොල තත්ත්වයක දී භාණ්ඩ මිලට ගැනීම, ආනයනය සහ භාණ්ඩ බෙදහැරීම වැනි දැනට ස. තො. ස. විසින් ඉටු කරනු ලබන කාර්යයන් කාර්යක්ෂමව ඉටු කර ගැනීමට නොහැකි වනු ඇතැයි උපකල්පනය කිරීම නිවැරදි නොවේ. රජය සතු ව්‍යාපාරික ආයතන, ආනයන වෙළෙඳාමෙහි නියුක්තව සිටීම, වෙළෙඳ වාතාවරණයෙහි ඉහළ මට්ටමක අවිනිශ්චිතතාවයක් ඇති කරලීමටත්, වඩාත් කාර්යක්ෂම පෞද්ගලික ව්‍යාපාරිකයන් වෙළෙඳ පොලෙන් බැහැරව තැබීමටත්, වෙළෙඳපොල කාර්යක්ෂමතාවයට බාධා පැමිණ වීමටත් හේතු වේ. එහෙයින්, පූර්ණ වශයෙන් රජය සතු වෙළෙඳ සංවිධානයක් වශයෙන් ස.තො.ස කටයුතු තවදුරටත් පුළුල් කිරීම සුදුසු නොවනු ඇත. වී මිල දී ගැනීම සඳහා ලබාගත් ණය මුදල් හා සම්බන්ධ මූල්‍ය වගකීම ඉටු කිරීමට වී අලෙවි මණ්ඩලය අපොහොසත් වීම නිසා එහි කටයුතු මහජන බැංකුවට බරක් වී ඇත. වී අලෙවි මණ්ඩලය තවදුරටත් පවත්වාගෙන යාම සාධාරණීකරණය කිරීමට අපහසු ය. වෙළෙඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුව මෙන් මෙම ආයතනයේ ද කටයුතු නවතා දැමීමට මෙය වඩාත් උචිත අවස්ථාවක් විය හැකිය.

දේශීය කෘෂිකාර්මික අංශයට දැනට වඩා ජාත්‍යන්තර වශයෙන් තරගකාරී අපනයන අතිරික්තයක් උත්පාදනය කිරීමට හැකිවිය යුතු ය. මේ සම්බන්ධයෙන් සංවර්ධනයක් සිදු කළයුතු අංශ වන්නේ කෘෂිභාණ්ඩ සැකසීම, ඇසිරීම, ගබඩා කිරීම සහ ක්ෂේත්‍ර බෝග හැසිරවීම, වැඩි ඵලදාවක් ලැබෙන බෝග වර්ග වැඩිදියුණු කිරීම සහ වෙළෙඳපොල සංවර්ධනය කිරීමයි. මෙම අංශයේ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා, තාක්ෂණික දැනුම හඳුන්වා දෙනුවස් කෘෂිකාර්මික පර්යේෂණ හා අධ්‍යාපන ක්‍රමය සහ ව්‍යාප්ති වැඩකටයුතු අතර සමීප සම්බන්ධතාවයක් ස්ථාපිත කළ යුතු ය.

විවිධ හේතු නිසා භාණ්ඩ මිල ගණන් ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ. මීට ප්‍රවාහන පිරිවැය අලෙවි කිරීමේ ක්‍රමවල ඇති විවිධ ලක්ෂණ, ප්‍රවාහනයේ දී භාණ්ඩ පලුදුවීම හා නරක්වීම සහ ප්‍රාදේශීය වශයෙන් ඉල්ලුම් ස්වභාවය තීරණය කරනු ලබන රුචිකත්වයෙහි ඇති විවිධත්වය ඇතුලත් වේ. ප්‍රාදේශීය වශයෙන් මෙලෙස භාණ්ඩ මිල ගණන් වෙනස් වීමට යටිතල පහසුකම්වල නොදියුණු තත්ත්වය ද තරමක් දුරට බලපායි. අවශ්‍ය ආයතනික පහසුකම් සංවර්ධනය කිරීම මගින් මෙම ප්‍රාදේශීය වෙනස්කම් අවම කර ගතහොත් ඉහළ ආදායම් ලැබීම තුලින් ගොවීන් ප්‍රතිලාභ ලබනු ඇත. බොහෝ දුරට පිටකොටුව වෙළෙඳපොල වටා සංකේන්ද්‍රණය වී ඇති කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි පද්ධතිය ද වෙනත් ප්‍රදේශවලට විමධ්‍යගත කෙරෙමින් පවතින අතර, මෙම පියවර නිසා ප්‍රදේශ අතර පවත්නා මිල වෙනස්කම් තරමක් දුරට අඩුවී ඇත. මෙම විමධ්‍යගත කිරීම පවතිද්දීත්, මුළු කෘෂිකාර්මික නිෂ්පාදිතයෙන් සියයට 30 ක් පමණ භාණ්ඩ හැසිරවීමේ දී සහ ප්‍රවාහනයේ දී විනාශ වන බව ඇස්තමේන්තු කර ඇත. භාණ්ඩ මිල ගණන් ගොවීන් වෙත ක්ෂණිකව ලබාදීමට සහ කාර්යක්ෂම ලෙස හා අඩු පිරිවැයකින් කෘෂි භාණ්ඩ ඇසිරීමේ හා ඒ හා සම්බන්ධ අනෙකුත් කටයුතු පිළිබඳ ව ගොවීන්ගේ අවබෝධය වැඩිකර ගැනීමට උපකාරී වන පරිදි ව්‍යාප්ති සේවාවන් වැඩිදියුණු කිරීමෙන්, ප්‍රාදේශීය වශයෙන් පවත්නා මිල ගණන්හි වෙනස්කම් සහ භාණ්ඩ විනාශවීම අවම කර ගත හැකිය.

කෘෂිකර්ම අමාත්‍යංශයට අනුව, ගොවිජන සේවා පනත යටතේ පිහිටුවා ඇති ගොවි සංවිධානවල කාර්යභාරය පුළුල් කිරීමට බලාපොරොත්තු වේ. මෙම ගොවි සංවිධාන ගොවි සමාගම් වශයෙන් දියුණු කිරීමට අපේක්ෂිතය. මෙම සංවිධාන විසින් රජයේ නිලධාරීන්ගේ සහභාගීත්වය ද ඇතිව, 'ගොවිජන කේන්ද්‍රය' (නිෂ්පාදන සේවා මධ්‍යස්ථානයක්) ලෙස නැවත නම් කර ඇති ගොවිජන සේවා මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කෙරේ. සියළුම කෘෂිකාර්මික වැඩසටහන් සහ විශේෂ ව්‍යාපෘති මෙම මධ්‍යස්ථාන මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. දේශීය කෘෂිකාර්මික අංශය සංවර්ධනය කිරීම සඳහා ගොවීන් අතර, සමුපකාර ක්‍රම ක්‍රියාත්මක වීම දිරි ගැන්විය යුතු වුව ද, ඉහත මධ්‍යස්ථාන විසින් ක්‍රියාත්මක කරන වැඩසටහන් ඔවුන්ගේ අරමුදල් වලින්ම කළයුතු අතර, ඒ සඳහා රජයේ සම්පත් මත රැඳී නොසිටියයුතු ය. රජයේ මධ්‍යකාලීන අරමුණ විය යුත්තේ, පෞද්ගලික අංශයට වඩාත් කාර්යක්ෂම ලෙස ඉටු කළහැකි සියළු ආර්ථික කටයුතුවලට මැදිහත්වීම අඩු කිරීමය. කෙසේ වෙතත්, වෙළෙඳපොල සහ යටිතල ව්‍යුහය සංවර්ධනය කිරීම උදෙසා රජය විසින් සහායක කාර්යභාරයක් ඉටු කළ යුතුව ඇත.

ප්‍රාදේශීය වශයෙන් කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය කලින් කල පැවැති රජයයන් විසින් පිළිගෙන තිබූ අතර, මෑතකාලීනව කර්මාන්තශාලා ප්‍රාදේශීය වශයෙන් පිහිටුවීමට දැඩි ප්‍රයත්නයක් දරා ඇත. ඇඟළුම් කර්මාන්තශාලා 200 ක් පිහිටුවීමේ වැඩසටහන, කොග්ගල නිදහස් වෙළෙඳ කලාපයක් පිහිටුවීම, පල්ලේකැලේ කාර්මික ජනපදයක් පිහිටුවීම මේ සඳහා ගනු ලැබූ එවැනි ප්‍රයත්න කීපයකි. ඉතා මෑතකාලීනව, 1997 වර්ෂයේ අයවැය ලේඛනය මගින් ප්‍රකාශිත දුෂ්කර ප්‍රදේශවල කර්මාන්තශාලා පිහිටුවීමේ දී දෙනු ලබන රාජ්‍ය මූල්‍ය දිරි ගැන්වීම්වලට අමතරව, සමස්ත ප්‍රාදේශීය සංවර්ධන ක්‍රමෝපායේ කොටසක් වශයෙන්, ප්‍රාදේශීය කාර්මික ජනපද පිහිටුවීම ප්‍රවර්ධනය කිරීමත්, දකුණු පළාත් සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමත් අවධාරණය කර ඇත. මෙම වැඩ සටහන් සඳහා මහා පරිමාණ වශයෙන් යටිතල පහසුකම් ගොඩ නැගීම අවශ්‍ය වන හෙයින් ඒ සඳහා විශාල වශයෙන් විදේශ සම්පත් අවශ්‍ය වේ. පෞද්ගලික අංශයේ සහභාගීත්වය ඇතිව, මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කොට තිබේ. එහෙයින් මෙම ව්‍යාපෘති සඳහා අරමුදල් පෞද්ගලික අංශයෙන් ලැබිය යුතු වේ. මෙම ව්‍යාපෘතිවල රජයේ මැදිහත්වීම අවම විය යුතු අතර, සහභාගීත්වය දේශීය සම්පත් සීමාවන්ට යටත්ව සිදුවිය යුතු ය. ණය සඳහා ඇපවීම වැනි, රජය විසින් ඇති කරගනු ලබන වක්‍රාකාර මූල්‍යමය බැඳීම් වලින් පැළකිය යුතුය.

වෙළෙඳ ප්‍රතිපත්තිවල 'දිශාව වන්නේ ප්‍රධාන' වශයෙන් ජාතික ආරක්ෂාව, මහජන සෞඛ්‍යය සහ සනීපාරක්ෂක හේතූන් සඳහා අවශ්‍ය යැයි සැලකෙන වඩාත් හොඳින් අර්ථ නිරූපනය කරන ලද පටු භාණ්ඩ ලැයිස්තුවකට පමණක් සීමා කරමින් ප්‍රමාණාත්මක අවහිරතා අවම කිරීමයි. යම් නිශ්චිත කර්මාන්ත වෙනුවෙන් අවම වෙළෙඳ ආරක්ෂණයක් අවශ්‍ය යැයි සැලකෙන විට එවැනි ආරක්ෂණයක් සරල කරන ලද තීරුබදු ව්‍යුහයක් තුළ යෝග්‍ය වූ තීරුබද්දක් පැනවීම වැනි මිල පදනම් කරගත් ක්‍රියාමාර්ග මගින් සුදුසු පරිදි ලබාදියයුතු වේ. ශ්‍රී ලංකාව දැඩි ආරක්ෂණ වෙළෙඳ ප්‍රතිපත්ති වලින් යුත් පාලන ක්‍රමයක සිට අඩු ආරක්ෂණ ප්‍රතිපත්ති ව්‍යුහයක් වෙත ගමන් කරමින් සිටී. අර්තාපල්, ළූණු සහ මිරිස් සඳහා පැවැති

ආනයන බලපත්‍ර අවශ්‍යතා ඉවත් කරමින් වර්ෂය තුළ දී තවදුරටත් එහි ප්‍රගතියක් ලබා තිබේ. රජය සහ පිටි ඇඹරුම් සමාගමක් වන ප්‍රීමා ලංකා සමාගම අතර පැවැති ගිවිසුමෙහි බැඳීම් ඉටු කරනු පිණිස තිරිඟු හා ධාන්‍ය ආනයනය තවදුරටත් බලපත්‍ර ක්‍රමය යටතේ පැවතුණි.

සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවට (ස.තො.ස) තිරිඟු ආනයනය සඳහා ඒකාධිකාරී බලය ලබා දී තිබේ. මෙය පෞද්ගලික අංශය සම්පූර්ණයෙන්ම ඉවත් කරමින් තරගකාරී වෙළෙඳ ක්‍රියාමාර්ග වලින් පාරිභෝගිකයාට ලැබිය හැකි ප්‍රතිලාභ අහිමි කරන අකාර්යක්ෂම වෙළෙඳ පිළිවෙතකි. පෞද්ගලික ආනයනවලට අවස්ථාව සැලසීම සඳහා වර්තමානයේ පවතින බලපත්‍ර ක්‍රමය ඉවත් කිරීමේ අදහස ඇතිව මෙම වැඩ පිළිවෙත නැවත පරීක්ෂණයට ලක් කිරීම වැදගත් වේ.

ජනතාව තුළ සෞඛ්‍ය තත්ත්වයන් පිළිබඳව දැනුවත්කම සහ අවධානය වැඩිවීමත්, මරණ හා සාඵල්‍ය අනුපාතිකය පහත වැටීමේ හේතුවෙන් වයස්ගත සංඛ්‍යාවේ සාපේක්ෂ වර්ධනයත් සමග සෞඛ්‍ය සේවා සඳහා වූ ඉල්ලුම වැඩි වෙමින් පවතී. සැපයුම් අංශයෙන් සලකන කල, අභ්‍යන්තර රෝගී සේවාවන්ගෙන් විශාල කොටසක් තවදුරටත් රජය විසින් සපයනු ලැබිය. පෞද්ගලික අංශයේ දායකත්වය මූලික වශයෙන් බාහිර රෝගීන් සඳහා වූ අතර එය විශාල වශයෙන් ව්‍යාප්ත විය. මෙම දායකත්වය තවදුරටත් පැවැති සම්පත් සීමාවන් මධ්‍යයේ වුව ද සෞඛ්‍ය සේවාවන්හි වර්ධනයක් ඇති කරනු ලැබිය. එම නිසා රෝග වැලැක්වීම සහ රෝග නිවාරණ යන සෞඛ්‍ය සේවා දෙ අංශයම සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය දිරි ගැන්වීම අවශ්‍ය වේ. විවිධ වාර්තාවන්හි කර තිබෙන නිර්දේශ කිරීම් ප්‍රවේශමෙන් පරීක්ෂා කර සෞඛ්‍ය අංශය වර්ධනය කිරීම සඳහා පැහැදිලි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු ය.

අධ්‍යාපන ක්‍රමය වර්ධනයවන ආර්ථිකයට අවශ්‍ය කුසලතාවයන් සපයා දීමට සමත් විය යුතු අතර අධ්‍යාපන ක්ෂේත්‍රයේ වර්ධනයන් සහ ශ්‍රම වෙළෙඳපොලෙහි අවශ්‍යතා අතර වර්තමානයේ පවත්නා නොගැලපීම අවම කළ යුතු ය. පෞද්ගලික අංශයේ පුළුල්වන අවශ්‍යතාවයන්ට සරිලන පරිදි කාර්මික, භාෂාමය, කළමනාකරණ සහ ව්‍යවසායක කුසලතා යනාදිය වැඩිදියුණු කිරීම සඳහා සුදුසු අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපනය කිරීම අවශ්‍ය වී ඇත. සාමාන්‍ය අධ්‍යාපනයේ ගුණාත්මක බව පිරිහීම සහ විවිධ සමාජ කණ්ඩායම් අනුව සහ ප්‍රාදේශීය වශයෙන් ගුණාත්මක බවින් යුත් ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනයක් ලබා ගැනීමට සමාන අවස්ථා නොපැවතීම අඛණ්ඩව පැවැති ගැටළු විය. උසස් අධ්‍යාපනයෙහි නිරතවූවන්ද ඇතුලත්ව ගුරු මණ්ඩලවල ගුණාත්මක භාවය හැකි ඉක්මණින් වර්ධනය කිරීම අවශ්‍ය වේ. පුහුණු කිරීමේ අවශ්‍යතා සම්බන්ධව උචිත ඇගයීමක් කිරීම, සියළුම අංශවල ගුරු මණ්ඩල සඳහා රැකියා සංවර්ධන වැඩපිළිවෙලක් ඇති කිරීම සහ තාක්ෂණික අධ්‍යාපනය සඳහා අවස්ථාවන් පුළුල් කිරීම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහනෙහි මූලිකත්වය දියයුතු අංශවේ.

බලශක්ති අංශය ගැන සලකන විට, ජලවිදුලි බලය මත දැඩි ලෙස රඳා පැවතීම අඩු කිරීම පැහැදිලි දිගුකාලීන සැලසුමක් සකස් කළයුතු වේ. ප්‍රවාහන අංශයෙහි ක්‍රියාපිළිවෙළහි සහ කළමනාකාරීත්වයෙහි අඛණ්ඩව පැවැති දුර්වලතා එහි වාණිජමය ශක්‍යතාවයට ගැටළු ඇති කරනු ලැබිය. මෙම අංශය ප්‍රවාහන සේවාවන් සඳහා වැඩිවන ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් ලෙස සකස් වී නොමැත. විදුලි සංදේශ පහසුකම්වල විශාල වැඩි දියුණුවක් පැවතිය ද වර්තමානයේ අළුත් දුරකථන මාර්ග සඳහා පවතින ඉල්ලුමෙන් සපුරාලිය හැකිකේ සියයට 50 ක් පමණි. භාණ්ඩ ප්‍රවාහන පහසුකම් සඳහා වැඩිවන ඉල්ලුම සපුරාලීම සඳහා, වරාය සේවා පද්ධතිය පුළුල් කිරීම සහ නවීකරණය කිරීම අවශ්‍ය වේ. මෙම යටිතල සේවාවන්වල තත්ත්වය වැඩිදියුණු කිරීමටත් පුළුල් කිරීමටත් සම්පත් විශාල වශයෙන් අවශ්‍ය විය හැකි බැවින් විදේශීය පෞද්ගලික අංශයේ සහභාගීත්වය ද ඇතුළත්ව හැකිතාක් දුරට පෞද්ගලික අංශයේ සහභාගීත්වය ඇතිව කළ යුතුව ඇත.

ලංකාවේ ශ්‍රම වෙළෙඳපල තුළ අනම්‍යශීලී සහ අවිධිමත් තත්ත්වයක් පවතී. ශ්‍රම වෙළෙඳපොල විශාල වශයෙන් කොටස්වලට බෙදී පවතී. රාජ්‍ය වැවිලි අංශය ද ඇතුළත් වූ සංවිධිත හා විශාල වශයෙන් පාලනයට යටත් වූ ශ්‍රම වෙළෙඳපලක් ද, සුළු පරිමාණ නිෂ්පාදකයින්, සේවා සපයන්නන් සහ කෘෂිකාර්මික ශ්‍රම බලකායෙන් වැඩි කොටසක් ද අයත් වූ පාලනයට යටත් නොවූ සහ අසංවිධිත වෙළෙඳපලක් ද පවතී. මෙම වෙළෙඳපලවල් අතර අන්තර් සම්බන්ධතාවය අවම මට්ටමක පවතී. කම්කරු නීති ඉතා දැඩි සහ සංකීර්ණ වේ. තැනින් තැන ඇතිවන කම්කරු ආරවුල් සහ කම්කරු ආරවුල් සමථයකට පත් කිරීමේ කල්ගත වන වැඩපිළිවෙලවල් නිසා පෞද්ගලික ආයෝජනවලට අයහපත් බලපෑමක් ඇතිවී තිබේ. නම්‍යතාවයක් ඇති කිරීමටත්, සේවක සේව්‍ය දෙපක්ෂය ඔවුන්ගේ සමාජයීය වගකීම් සම්බන්ධව දැනුවත් කිරීමටත්, වැටුප් ඵලදායිතාවය මත තීරණය කිරීමටත් ශ්‍රම වෙළෙඳපල ප්‍රතිපත්ති සරල කිරීම සහ ඒවායෙහි පැහැදිලි භාවයත් ඇති කිරීම කඩිනම්ව කළයුතුව ඇත. මෙම අරමුණු ඉටුකර ගැනීම ප්‍රමුඛ කරගත් ශ්‍රම වෙළෙඳපල ප්‍රතිසංස්කරණ අනිකුත් අංශවල ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවලට අනුපූරක වන අතර එම ප්‍රතිසංස්කරණවල ප්‍රතිලාභ නිවු කරනු ඇත.

විදේශ විනිමය සම්පත් වලින් ලැබෙන දායකත්වයට අමතරව, ආදායම් සහ සේවානියුක්තිය ඉපදවීමෙහි ප්‍රධාන මූලාශ්‍රයක් වශයෙන් ලංකාවෙහි සංචාරක ව්‍යාපාරයට පැහැදිලි සාපේක්ෂ වාසි පවතී. ජනවාර්ගික ගැටුම් හා සම්බන්ධ ප්‍රශ්ණ සමථයකට පත්වේ යැයි උපකල්පනය කළ විට සංචාරක අංශය නැවත ඉක්මණින් යථා තත්ත්වයට පත්වනු ඇත. මේ සම්බන්ධයෙන් වර්ධනය වන සංචාරක කර්මාන්තයට ප්‍රමාණවත් පරිදි ප්‍රවාහන පහසුකම් ගුවන් තොටුපල පහසුකම් යනාදිය පැවතිය යුතු ය. ගුවන් ගමන් පහසුකම් තරගකාරී මිල ගණන්වලට සැපයිය හැකි නම් ශ්‍රී ලංකාව සංචාරකයින්ට වඩාත් සිත් ඇදගන්නා ස්ථානයක් වනු ඇත. ජාතික ගුවන් සේවාව වන එයාර් ලංකා ගුවන් සේවය පෞද්ගලීකරණය කිරීමේ යෝජනාව මේ සම්බන්ධයෙන් වැදගත් පියවරක් වනු ඇත. එය, රට තුලට අනිකුත් ගුවන් සේවාවන් පැමිණීම සීමා කෙරෙන ආකාරයේ විදේශීය ආයෝජකයින්ට ඒකාධිකාරී බලයක් ලැබෙන පරිදි සිදු නොවිය යුතු ය.

ශ්‍රී ලංකාව මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙලෙහි සැලකිය යුතු වැඩ කොටසක් නිමා කර ඇත (1 වැනි විශේෂ සටහන) . කෙසේ නමුත්, ශ්‍රී ලංකාවේ මූල්‍ය අතරමැදිකරණයේ පිරිවැය අඩු කිරීම උදෙසා මෙම අංශයෙන් තවදුරටත් වර්ධනයන් සිදු කළ යුතුව ඇත. මූල්‍ය ක්‍රමය අධීක්ෂණය කිරීම ශක්තිමත් කිරීමට අමතරව, රාජ්‍ය බැංකු දෙකෙහි වාණිජමය ශක්‍යතාව වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිසංස්කරණයන් අත්‍යවශ්‍යව තිබේ. රාජ්‍ය බැංකු දෙක දැනුදු බැංකු ක්‍රමයේ මුළු වත්කම් වලින් තුනෙන් දෙකකට පමණ දායක වන අතර, ඒවායේ අකාර්යක්ෂමතා මුළු මූල්‍ය ක්‍රමයටම ක්ෂණිකව බලපානු

ඇත. වෙළෙඳපොලෙහි කතිපයාධිකාරී බලයක් ඇති මෙම රාජ්‍ය බැංකු දෙකෙහි අධික අතරමැදිකරණ පිරිවැය හේතුවෙන් ණය සහ තැන්පතු අනුපාතයන් අතර පරතරය ඉහළ මට්ටමක පවතී. එවැනි ව්‍යුහාත්මක දුර්වලතාවයන් හේතුවෙන් පොලී අනුපාතික පහත බැසීම කෙරෙහි ප්‍රවණතාවයක් දක්වන විට මුල්‍ය ප්‍රතිපත්ති උපකරණවල විශේෂයෙන් පොලී අනුපාතික ප්‍රතිපත්තියෙහි, කාර්යක්ෂම බව අඩු වේ. ඉහළ ණය පොලී අනුපාතිකයන්, පෞද්ගලික ආයෝජන සහ ආර්ථික වර්ධනය කෙරෙහි අහිතකර ලෙස බලපායි. එම නිසා එවැනි අධික අතරමැදිකරණයේ පිරිවැය සඳහා හේතුවන මූල සාධකයන් ඉවත් කිරීම වඩා වැදගත් වනු ඇත.

මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා උපයෝගී කරගත හැකි හොඳම පළමු ක්‍රියාමාර්ගය ලෙස රාජ්‍ය බැංකු පෞද්ගලීකරණය කිරීම දැක්විය හැකිය. මෙමගින් එම බැංකුවල මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කළහැකිවනු ඇත. රාජ්‍ය බැංකු පෞද්ගලීකරණය කිරීම ප්‍රවේශමෙන් මැදිහත් වියයුතු කරුණක් වන අතර එසේ කිරීම සඳහා කලින් කළයුතු කාර්යයන් රාශියක් ඇති හෙයින් කඩිනම්ව එය කළ නොහැකිවේ.. මේ අතර පෞද්ගලීකරණය කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිලාභ පිළිබඳ මහජනයා සහ සේවා නියුක්තිකයින් දැනුවත් කිරීම ද අත්‍යවශ්‍ය වේ. රාජ්‍ය බැංකුවල වාණිජමය ශක්‍යතාවය වර්ධනය කිරීම පිණිස බැංකු රාජ්‍ය අයිතිය තුළම ප්‍රතිව්‍යුහගත කිරීම, ඊළඟ විකල්පයයි. රාජ්‍ය බැංකු දෙකට අනිකුත් වාණිජ බැංකුවලට අමතරව, වාණිජ බැංකු නොවන අනෙකුත් ආයතන සමග ද තරගකාරීත්වයට මුහුණ දීමට සිදුව ඇති හෙයින් මුල්‍ය ක්‍රමය තුළ ඉහළ තරගකාරීත්වයක් පවතින මෙවැනි අවස්ථාවක එම බැංකු ප්‍රතිව්‍යුහගත කිරීම අවශ්‍ය වේ.

තරගකාරී පරිසරයක් තුළ අධීක්ෂණ ක්‍රියාමාර්ගයක කාර්යභාරය ඉතා වැදගත් ස්ථානයක් හිමිකර ගනී. වාණිජ බැංකු සහ මුල්‍ය සමාගම්වලට අමතරව, විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක සහ බලයලත් විශේෂ කාර්යයන්හි නියැලුනු බැංකු අධීක්ෂණය කිරීමේ බලය ද මෑත දී සිදු කරනු ලැබූ ව්‍යවස්ථා සංශෝධන වලින් මහ බැංකුවට පැවරුණි.

නව ආර්ථික පරිසරයක් තුළ මුල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මහ බැංකුවට මුහුණ දීමට සිදුව ඇති ප්‍රධාන අභියෝගයකි. දේශීය ආර්ථිකය ලෝක ආර්ථිකයන් සමග ඒකාබද්ධවී ඇති පූර්ණ නිදහස් ආර්ථික ක්‍රමයක් තුළ සෘජු පාලන වැනි සාම්ප්‍රදායික මුල්‍ය උපකරණයන්ගේ බලපෑම අඩුවී ඇත. එම නිසා මුල්‍ය වෙළෙඳපොල වර්ධනය කිරීම සඳහා වෙළෙඳපොල පදනම් කරගත් මුල්‍ය ප්‍රතිපත්ති උපකරණ යොද ගත යුතු වේ. හිතකර බැංකු පරිචයන් අනුගමනය කිරීම තහවුරු වන අයුරින් අධීක්ෂණ ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීම මුල්‍ය කළමනාකරණයට ද මහෝපකාරී වේ. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග මහ බැංකුව දැනටමත් ආරම්භ කර ඇත.

රාජ්‍ය මුල්‍ය අංශය සලකා බලනවිට උද්ධමනකාරී නොවන ආර්ථික වර්ධනය කඩිනම් කිරීම පිණිස රාජ්‍ය මුල්‍ය වියදම් දැරිය හැකි තත්ත්වයකට අඩු කිරීමේ මාර්ගයකට යොමුවීම සඳහා පැහැදිලි කැපවීමකින් කටයුතු කර ඇත. මෙම අරමුණ සපුරා ගැනීම සඳහා පසුගිය දෙවසර තුළ නිවැරදි පියවර කිහිපයක් ගනු ලැබිණි. ආදායම් අංශය සලකා බලන කල, බදු පදනම වැඩිදියුණු කිරීම, බදු ව්‍යුහය සරල කිරීම සහ බදු අනුපාතිකයන් අඩු කිරීම, බදු අත්හැරීම අවම කිරීම, බදු පරිපාලනය වැඩි දියුණු කිරීම සහ රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය කිරීම මෙයට ඇතුළත් වේ. වියදම් අංශයෙහි ප්‍රතිසංස්කරණවලට, ගෘහසාධන වැඩසටහන් වල ප්‍රතිලාභ ලැබියයුතු සුදුස්සන්ට සීමා කිරීම, නාස්තිකාරී වියදම් අවම කිරීම, සංස්ථාවලට කරන පැවරුම් අඩුකිරීම සහ උපයෝගිතා සේවා සඳහා ගාස්තු වැඩිකිරීම ඇතුළත් වේ. තිරිඟු පිටි මිල ගණන් ද ඒ සඳහ දැරීමට සිදුවන වියදමට ආසන්න වන පරිදි වැඩි කරන ලදී. කෙසේ වුව ද, තවදුරටත් රජය විසින් තිරිඟු පිටි මිල තිරණය කරන බැවින් අනාගතයේ දී පිටි සහනාධරය නැවත ක්‍රියාත්මක නොවන බවට සහතිකයක් විය නොහැක. එම නිසා තිරිඟු පිටි සහ පාන් සඳහා මිල ගණන් නිදහස් වෙළෙඳපොල මගින් තිරණය වීම සහතික වන ආකාරයේ ක්‍රියාමාර්ගයක් ඇති කළ යුතු වේ. පෞද්ගලික අංශයට තිරිඟු ආනයනය කිරීමට අවසර දීමත්, පිටි ඇඹරීමේ සමාගම සමග කෙලින්ම ගණුදෙනු කිරීමට අවකාශ ලබාදීමත් මගින් මෙම තත්ත්වය ඇති කළ හැකිය. ඛණිජ තෙල් නිෂ්පාදන සඳහා නම්‍ය මිල ක්‍රමයක් ඇති කිරීම සහ ඛණිජ තෙල් ආනයනය සහ සැකසීම සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය ධෛර්යමත් කිරීම පෞද්ගලීකරණ වැඩපිළිවෙලෙහි ඉදිරි දියුණුව සඳහා වැදගත් පියවරයන් වේ.

ඉහළ අයවැය හිගයන් පැවැතීම ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික අස්ථායිතාව සඳහා බලපාන ප්‍රධාන සාධක වලින් එකකි. පොලී වියදම් නිසා අයවැයට ඇති බර අඩු කිරීම සඳහා විටින් විට ගන්නා නුසුදුසු මැදිහත්වීම් නිසා මුල්‍ය වෙළෙඳ පොලෙහි ඇති පොලී අනුපාතිකයන් විකෘතිවීම සිදු වනු ඇත. අයවැය හිගය පියවීම සඳහා පරිපාලනමය ණය ගැනීම් තුළදී මෙම තත්ත්වය දැකිය හැකිය. 1996 වසරේ දී පරිපාලන ණය ගැනීම් දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට එකක් ඉක්මවිය. මෙය තාවකාලික වශයෙන් පොලී අනුපාතයන් අඩු කිරීමට සහ රාජ්‍ය ණය ගැනීම්වල පිරිවැය අඩු කිරීමට හේතු වුවත් මුල්‍ය වෙළෙඳපොල තුළ මෙමගින් ඇති කරන විකෘති තත්ත්වයන් නිසා රාජ්‍ය මුල්‍ය කළමනාකරණය සඳහා මෙම උපකරණය මත රැඳී සිටීම එතරම් යෝග්‍ය නොවේ. මෑතකදී හඳුන්වා දුන් භාණ්ඩාගාර බැඳුම්කර දීර්ඝකාලීන සහ මධ්‍ය කාලීන බැඳුම්කර සඳහා වෙළෙඳපොල මත පදනම් වූ ඵලදායිතා රටාවක් ස්ථාපිත කිරීමට උපකාරී වන බැවින්, ස්ථාවර පොලියක් සහිත රුපියල් සුරැකුම් වලට සාපේක්ෂව ඉදිරි පියවරක් වේ.

ඉහළ යන ආරක්ෂක වියදම්වලට අමතරව ඉහළ මට්ටමක පවතින රාජ්‍ය ණය හේතුවෙන් වේගයෙන් ඉහළ යන පොලී වියදම ද, රාජ්‍ය අංශයේ වේතන සහ කුටුම්භයන් සඳහා සපයන සංක්‍රාම ද, අධික රාජ්‍ය මුල්‍ය අපහසුතාවයට හේතු විය. රාජ්‍ය මුල්‍ය කළමනාකරණය සඳහා ප්‍රධාන සංරෝධකයන් කිහිපයක් පැවතුණි. මුළු රාජ්‍ය ආදායමෙන් සියයට 70 ක්, රාජ්‍ය ණය සඳහා පොලිය, රාජ්‍ය අංශයේ වැටුප්, වේතන සහ විශ්‍රාම වැටුප් සඳහා වියදම් වන බැවින් ප්‍රාග්ධන සම්පාදනය, රාජ්‍ය ණය වාරිකයන් ගෙවීම සහ අනෙකුත් අත්‍යවශ්‍ය සේවාවන් නඩත්තු කිරීම ඇතුලත් අනෙකුත් වියදම් සඳහා යොද ගැනීමට සිදු ඇත්තේ ඉතිරි සියයට 30 ක ප්‍රමාණය පමණි.' අයවැය තුළ ඇති ව්‍යුහමය දුර්වලතා ඉවත් කිරීම ඉලක්ක කරගත් වැඩපිළිවෙලවල් මගින් එම දුර්වලතා ඉතා ඉක්මනින් නිවැරදි කළ යුතු වේ. මෙම වැඩපිළිවෙල තුළට රාජ්‍ය පරිපාලන සේවයේ ප්‍රතිසංස්කරණය තුළින් රාජ්‍ය අංශයේ අකාර්යක්ෂමතාවයන් අඩු කිරීමේ ශක්තිමත් ක්‍රියාමාර්ග, සේවකයින් විසින් දායකත්වයන් සපයන නොකඩවා පවත්වාගෙන යා හැකි විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමයන් ඉලක්ක කර ගනිමින් විශ්‍රාම වැටුප් ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම, ආර්ථිකය තුළ රාජ්‍ය අංශයේ දායකත්වය අඩුකිරීමේ පැහැදිලි සහ ස්ථිර සැලසුමක් සහිතව භාණ්ඩාගාර මුල්‍ය කළමනාකරණය

විශේෂ සටහන 1

ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිසංස්කරණ වර්ෂ පිළිවෙල

1977 - **ප්‍රධාන ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙලක ආරම්භය**

පොලී අනුපාතිකය : ඉතිරි කරන්නන්ට සෑහෙන තරම් ඉහළ මූර්ත ඵලදාවක් ලබාදීමේ අරමුණෙන්, රජයේ ඉතිරි කිරීම් ආයතනය වන ජාතික ඉතිරිකිරීමේ බැංකුව සිය තැන්පතු පොලී අනුපාතික තියුණු ලෙස ඉහළ නැංවීය. ඉන් අනතුරුව, වාණිජ බැංකු තැන්පතු සහ ණයදීමේ අනුපාතික ද ඉහළ යන පරිදි සංශෝධනය කරනු ලැබීය.

විනිමය පාලනය : තෝරාගත් ජංගම ගිණුම් ගනුදෙනු සඳහා වාණිජ බැංකු වෙත බලය පවරා දීම. සංචාරක, ව්‍යාපාරික, වෛද්‍ය ප්‍රතිකාර, අධ්‍යාපනය හා විගමනය යන අරමුණු සඳහා ලබාගත හැකි විනිමය ප්‍රමාණය වැඩි කිරීම.

විනිමය අනුපාතිකය : ඇ.එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල සියයට 44 කින් අවප්‍රමාණය කරමින් පෙතෙක් පැවැති ද්විත්ව විනිමය අනුපාතික ක්‍රමය අහෝසිකර, ඒකීය විනිමය අනුපාතිකයක් භාවිතා කිරීම ඇරඹුණි.

ඇ.එ.ජ. ඩොලරය මැදිහත්වීමේ ව්‍යවහාර මුදල ලෙස යොදා ගනිමින්, ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය වෙනුවට පාලිත නම්‍ය විනිමය අනුපාතික ක්‍රමය භාවිතා කෙරුණි. ප්‍රධාන ව්‍යවහාර මුදල් වර්ග ගයක් සඳහා මහ බැංකුව දෛනික අනුපාතික නියම කළේය.

1978 - **වරණීය ණය සීමා:** ණය දීම සහ කුලී සින්නක්කර කටයුතුවල නියැලි මූල්‍ය සමාගම් වෙත වාණිජ බැංකු විසින් දුන් ණය පිළිබඳ පනවා තිබූ සීමා ලිහිල් කරන ලද අතර ව්‍යවස්ථාපිත මණ්ඩල වලට හා රාජ්‍ය සංස්ථා වලට දෙන වාණිජ බැංකු ණය සඳහා වූ වරණීය ණය සීමා ඉවත් කරන ලදී.

විනිමය පාලනය : ව්‍යාපාරික, සංචාරක හා අධ්‍යාපන කටයුතු සඳහා ලබා ගත හැකි විනිමය ප්‍රමාණය වැඩි කරන ලදී. ශ්‍රී ලාංකිකයන් සහ විදේශිකයන් සඳහා අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ඇරඹීමට වාණිජ බැංකු වලට අවසර දෙන ලදී. පිළිවෙත් සරල කිරීමෙන් සහ තවදුරටත් විනිමය පාලන කටයුතු වාණිජ බැංකු වෙත පැවරීමෙන් විනිමය පාලනය ලිහිල් කරන ලදී.

- **මහ කොළඹ ආර්ථික කොමිසම :** ශ්‍රී ලංකාවෙහි අපනයන සැකසුම් කලාපයන්හි දේශීය හා විදේශීය ආයෝජනයන් පහසු කිරීම සඳහා මහ කොළඹ ආර්ථික කොමිසම පිහිටුවන ලදී.

1979 - **අධීක්ෂණය :** 1979 අංක 27 දරණ මූල්‍ය සමාගම් පාලනය පනත යටතේ මූල්‍ය සමාගම් අධීක්ෂණය සහ විධිමත් කිරීම පිළිබඳ කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආරම්භ කරන ලදී.

- **ආයතනමය :** නීතිරීති ලිහිල් කිරීමට අනතුරුව, විදේශීය බැංකු තුනක් ශ්‍රී ලංකාවෙහි ශාඛා විවෘත කළහ.

- විශේෂයෙන්ම, අපනයන සැකසුම් කලාපයන්හි විදේශික ආයෝජකයන් හට එතර බැංකු පහසුකම් සැලසීම සඳහා විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක පිහිටුවන ලදී.

1980 - **පරිපාලිත පොලී අනුපාතික :** මහ බැංකු පොලී අනුපාතිකය (Bank Rate) භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකය, රජයේ සුරැකුම්පත් පොලී අනුපාතිකය සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ තැන්පතු පොලී අනුපාතිකය යන පරිපාලිත පොලී අනුපාතිකයන් ඉහළ නංවන ලද අතර වාණිජ බැංකු මෙය අනුගමනය කරන ලදී.

- **විනිමය පාලන :** අනේවාසික විජාතික විදේශීය ව්‍යවහාර මුදල් ගිණුම් ක්‍රමය ආරම්භ කරන ලදී.

- **මූල්‍ය ප්‍රතිපත්තිය :** බැංකු ක්‍රමයේ නවෝත්පාදනයන් සැලකිල්ලට ගත හැකිවන සේ, මූල්‍ය ප්‍රතිපත්ති අරමුණු සඳහා භාවිතා කරන මුදල් සමස්තයේ නිර්වචනය වෙනස් කරන ලදී. මේ අනුව, පුළුල් මුදල් සැපයුම (M_2) හඳුන්වා දෙන ලදී.

1981 - **ද්විතීය වෙළෙඳපොල :** භාණ්ඩාගාර බිල්පත් සඳහා ද්විතීය වෙළෙඳපොල හඳුන්වා දෙන ලදී.

- **විනිමය පාලන :** මෙරටට ලැබෙන ප්‍රේෂණයන්, සංචාරක චෙක්පත් සහ විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ඇ.එ.ජ. ඩොලර් 500 ට අඩුවන අවස්ථාවල, මූලය හා අරමුණු පිළිබඳ තොරතුරු ලබාගැනීමකින් තොරව මුදල් කිරීමට වාණිජ බැංකු වලට අවසර දෙන ලදී.

1982 - **වරණීය ණය සීමා :** නේවාසිකයින්ට හෝ ශ්‍රී ලංකාවෙහි ලියාපදිංචි සමාගම් වලට වතු සහ නිශ්චල දේපළ මිල දී ගැනීමට සපයන බැංකු ණය මත වූ සීමා ඉවත් කරන ලදී.

- **විනිමය අනුපාතිකය :** මහ බැංකුව විසින් දෛනිකව නියම කළ විනිමය අනුපාතික ප්‍රකාශයට පත් කිරීම, මැදිහත් වීමේ ව්‍යවහාර මුදල වන ඇ.එ.ජ.ඩොලරයට පමණක් සීමා කරන ලදී.

- **සේවක හරකාර අරමුදල :** රජය විසින් දෙවැනි අධිවාර්ෂිකත්ව අරමුදල පිහිටුවන ලදී.

1983 - **ණය සීමා :** වාණිජ බැංකු මත වූ සමස්ත ණය සීමා ඉවත් කරන ලදී.

- **ආයතනමය වෙනස්කම් :** ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම් හා වාණිජ බැංකු පිහිටුවීමට අවසර දෙන ලදී.

1984 - **මූල්‍ය ප්‍රතිපත්තිය :** සෘජු නොවූ මූල්‍ය පාලන උපකරණ සහ විවෘත වෙළෙඳපොල කටයුතු කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරුණි.

1985 - **ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු :** 1985 අංක 15 දරණ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පනත යටතේ මෙම බැංකු පිහිටුවන ලදී.

1986 - **විනිමය පාලන :** විදේශයන්හි අධ්‍යාපන කටයුතු කිරීම සඳහා වූ විනිමය හිමිකම් තවදුරටත් වැඩි කෙරුණි. දිනකට රුපියල් 100,000 ට වැඩි වටිනාකමක් ඇති සංචාරක චෙක්පත් මුදල් කිරීමේ දී විනිමය පාලන අනුමැතිය ලබා ගැනීම් සඳහා වූ අවශ්‍යතාවය ඉවත් කරන ලදී.

1987 - **කොටස් වෙළෙඳපොල :** 1987 අංක 36 දරණ සුරැකුම්පත් සභා පනත යටතේ, ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් වෙළෙඳපොල විධිමත් කිරීමේ කාර්යය සඳහා සුරැකුම්පත් සභාව පිහිටුවන ලදී.

1988 - **පොලී අනුපාතික :** කලින් පැවති පොලී අනුපාතික පරිපාලනමය ලෙස තීරණය කිරීමේ පිළිවෙත වෙනුවට, ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළේ පොලී අනුපාතික වෙළෙඳ පොළ තත්ත්වයන් මත තීරණය වීමට ඉඩ දෙන ලදී.

- **අධීක්ෂණය :** 1988 අංක 30 දරණ බැංකු පනත ක්‍රියාත්මක වූ අතර, නව පනත යටතේ වාණිජ බැංකු වෙත නව නියෝග හා උපදෙස් නිකුත් කරන ලදී. 1988 අංක 78 දරණ මූල්‍ය සමාගම් පාලන පනත යටතේ මහ බැංකුවට වඩා පුළුල් බලතල පැවරුණ අතර, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය සඳහා නව දෙපාර්තමේන්තුවක් පිහිටුවන ලදී.

1989 - **විචක්ෂණ විධිවිධාන :** වාණිජ බැංකු සඳහා අවම ද්‍රවශීල වත්කම් අනුපාත සහ තනි ණය ගනුදෙනු කරුවනට ගත හැකි උපරිම ණය පිළිබඳ සීමා පනවන ලදී.

1990 - **විනිමය පාලන** : අනුමත දේශ අරමුදල්, කලාපීය අරමුදල් සහ නේවාසික නොවන පුද්ගලයන්ට ලැයිස්තුගත සමාගම් වල නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 40 ක් දක්වා කොටස් වල ආයෝජනය කිරීමට අවසර දෙන ලදී. මේ සමගම, එවැනි ආයෝජන පහසු කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් මගින් කොටස් ආයෝජන බාහිර රුපියල් ගිණුම් ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

- **විනිමය අනුපාතිකය** : මහ බැංකුව ඇ.එ.ජ.ඩොලරය සඳහා තීරණය කළ විනිමය අනුපාතික ප්‍රකාශයට පත් කිරීම අත්හල අතර, සෑම දිනක් ආරම්භයේම ඇ.එ.ජ. ඩොලරය සඳහා මිලදී ගැනීමේ සහ විකිණීමේ අනුපාතික ප්‍රකාශයට පත් කිරීමට පටන් ගන්නා ලදී. දවස තුළ මෙම අනුපාතික වෙනස් කළ හැක.

- **ණය තොරතුරු කාර්යාංශය** පිහිටුවන ලදී.

- **ණය ආපසු අය කර ගැනීම** : වාණිජ බැංකුවල ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියා පිළිවෙළ පහසු කරලීම සඳහා 1990 අංක 2 දරණ ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත, 1990 අංක 3 දරණ උකස් (සංශෝධිත) පනත සහ 1990 අංක 4 දරණ බැංකු විසින් ණය අයකර ගැනීම් (විශේෂ විධිවිධාන) පනත සම්මත කරන ලදී.

1991 - **මූල්‍ය සහ බැංකු කටයුතු පිළිබඳ ජනාධිපති කොමිසම වැඩ ඇරඹීය.**

- **කොටස් වෙළෙඳපොල** : ඒකක භාරයන් විධිමත් කිරීම ඇතුළුව පුළුල් බලතල පවරමින් සුරැකුම්පත් සහ හුවමාරු කොමිසම පිහිටුවීම සඳහා සුරැකුම් පත් සහා පනත සංශෝධනය කරන ලදී. ඇතැම් නියම හා කොන්දේසි වලට යටත්ව, කොළඹ කොටස් හුවමාරුවෙහි ගනුදෙනු වන සුරැකුම් වල ආයෝජන කිරීම සඳහා පිටරට සංස්ථාපිත සමාගම් වලට අවසර දෙන ලදී.

- **ආයතනික වෙනස්කම්** : ඒකක භාරයනට බලපත් නිකුත් කිරීම සඳහා අනුමැතිය දෙන ලදී.

- **විනිමය පාලන** : අපනයන ඇණවුම් සඳහා අපනයන සැකසීමට අවශ්‍ය යෙදවුම් ආනයනය සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම්, විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්ගෙන් ණයට ගැනීමට අපනයනකරුවන් හට අවසර දෙන ලදී.

- මුදල් මාරු කරන්නන් පත් කළ අතර, ඔවුන්ට විදේශ ව්‍යවහාර මුදල් මිල දී ගැනීමට සහ රුපියල් හෝ වෙනත් විදේශීය ව්‍යවහාර සඳහා හෝ විදේශී ව්‍යවහාර මුදල් හුවමාරු කිරීමට බලය පවරන ලදී.

- ශ්‍රී ලංකාවේ නේවාසිකයින් හට සහ නේවාසික නොවන්නන් හට නේවාසික විදේශීය ව්‍යවහාර මුදල් ගිණුම් ඇරඹීමට ඉඩ දෙන ලදී.

1992 - **ණය සීමා** : තෝරාගත් ප්‍රමුඛ නොවන අංශයනට වාණිජ බැංකු දෙන ණය සඳහා පනවා තිබූ ණය සීමා ඉවත් කෙරුණි.

- **විනිමය පාලන** : විනිමය පාලක විසින් පනවන බැහැර කිරීම්, සීමා හා කොන්දේසිවලට යටත්ව ලැයිස්තු ගත සමාගම් නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 100ක ප්‍රතිශතයක් දක්වා ආයෝජනය කිරීමට දේශ අරමුදල්, කලාපීය අරමුදල්, නේවාසික නොවන පුද්ගලයන් සහ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සියළුම සාමූහික ආයතනයනට අවසර දෙන ලදී.

- **භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල** : ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලට සහභාගී වීම සඳහා බලයලත් ප්‍රාථමික වෙළෙඳ නියෝජිතයන් පත් කිරීම, මහජනයා විසින් ලංසු ඉදිරිපත් කළ යුත්තේ මෙම නියෝජිතයන් මගිනි.

- **විදේශීය ආයෝජන** : මහ කොළඹ ආර්ථික කොමිසමෙහි තත්ත්වය ආයෝජන මණ්ඩලයක මට්ටමට ඉහළ නංවන ලද අතර, එහි බල ප්‍රදේශය ද සීමිත කලාප සිට මුළු දිවයිනටම බලපාන ලෙස පුළුල් කෙරුණි.

1993 - **නව ප්‍රාග්ධන ප්‍රමාණතා** : වාණිජ බැංකු සඳහා නව ප්‍රාග්ධන ප්‍රමාණතා පිළිබඳ සම්මතයන් ද බාල් (Basle) මග පෙන්වීම් අනුව හඳුන්වා දෙන ලදී.

- **ප්‍රතිප්‍රාග්ධනීකරණය:** මූල්‍යමය ශක්‍යතාවය සහ ලාභදායීතාවය යළි ඇතිකරලීමට සහ ජාත්‍යන්තරව පිළිගත් මට්ටම් දක්වා ප්‍රාග්ධනය වැඩි කිරීම සඳහා රාජ්‍ය බැංකු දෙක ප්‍රතිප්‍රාග්ධනීකරණය කිරීම.

- **ප්‍රාග්ධන පදනම පුළුල් කිරීම** : මහජන කොටස් නිකුතුවක් මගින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංවර්ධන බැංකුවක් වන ජාතික සංවර්ධන බැංකුවේ ප්‍රාග්ධන පදනම ප්‍රසාරණය කිරීම.

- **විනිමය පාලන** : අපනයන සඳහා ලද මුදල් ඉපැයුම් නැවත රටට ගෙන්වා ගැනීම සහ බැංකු වෙත විකිණීමට වූ අවශ්‍යතා අහෝසි කරන ලදී. අපනයන ඉපැයුම් මෙරට හෝ පිටරට විදේශීය ව්‍යවහාර මුදල් ගිණුම් වල තබා ගැනීමට අවසර දෙන ලදී.

- සංචාරක, එතෙර අධ්‍යාපනය සහ විවිධ අරමුණු සඳහා වූ ප්‍රේෂණ පිළිබඳව ඉතිරිව පැවැති සීමා කිරීම් ද ඉවත් කෙරුණි.

- **භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල** : භාණ්ඩාගාර බිල්පත් පුනි මිළදී ගැනීමේ ගිවිසුම් මත විකිණීම මහ බැංකුව විසින් ආරම්භ කරන ලදී.

1994 - **විනිමය පාලන** : ජාත්‍යන්තර ජංගම ගනුදෙනු සඳහා ඉතිරිව පැවැති සියළුම සීමා ඉවත් කෙරුණි. ශ්‍රී ලංකාව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අධිකාර පත්‍රයේ VIII වැනි වගන්තිය යටතේ වූ සියළු බැඳීම් පිළිගන්නා ලදී.

- **භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල** : බලයලත් ප්‍රාථමික වෙළෙඳ නියෝජිත ක්‍රමය වෙනස් කොට විශේෂිත වරප්‍රසාද හා වගකීම් සහිත ප්‍රාථමික වෙළෙඳ නියෝජිත ක්‍රමය හඳුන්වා දෙන ලදී.

1995 - **භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල** : මහ බැංකුව විසින් ද්විතීයික වෙළෙඳ පොල ගනුදෙනු සඳහා පුනි විකුණුම් ගිවිසුම් හඳුන්වා දෙන ලදී.

- **විදේශීය ණය ගැනීම්** : සිය ප්‍රාග්ධන සහ සංචිතයන් ගෙන් සියයට 5 දක්වා විදේශීය ණය ලබා ගැනීමට වාණිජ බැංකු වලට අවසර දෙන ලදී.

- **විනිමය අනුපාතිකය** : වෙළෙඳපොලට වැඩි නම්‍යතාවයක් ලබාදීම සඳහා ඇ.එ.ජ. ඩොලරය සඳහා මහ බැංකුව මගින් දෛනිකව නියම කරන ගැනුම් සහ විකුණුම් මිල අතර පරතරය සියයට 1 සිට සියයට 2 දක්වා වැඩි කරන ලදී.

- **නීති අණපනත් සංශෝධන** : මූල්‍ය වෙළෙඳපොළෙහි ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහා වැදගත් පනත් ගණනාවක් සංශෝධනය කරන ලදී.

- ණය තොරතුරු කාර්යාංශ පනත : ආයතන වැඩි ගණනකට කාර්යාංශයෙන් ප්‍රයෝජන ගත හැකිවීම සඳහා.

- ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත : ප්‍රාග්ධන පදනම ප්‍රතිව්‍යුහගත කිරීමට සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ කටයුතු වෙළෙඳපොල පදනමක් මත සිදු කිරීම කෙරෙහි වඩා නැඹුරු කරලීමට.

- බැංකු පනත : ජාතික ඉතිරි කිරීමේ බැංකුව, සංවර්ධන මූල්‍ය සංස්ථාව, ජාතික සංවර්ධන බැංකුව සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව මහ බැංකුවේ අධීක්ෂණයට යටත් කිරීමට සහ විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක මහ බැංකුවේ වඩාත් නියුණු අධීක්ෂණයකට යටත් කරලීමට.

- මුදල් නීති පනත, ලියාපදිංචි කොටස්, සහ සුරැකුම් ආඥා පනත සහ දේශීය භාණ්ඩාගාර බිල් පත් ආඥා පනත : යශතික පත් රහිත රජයේ සුරැකුම් පත් ක්‍රමයක් පිහිටුවීමේ කටයුතු පහසු කිරීම, වෙළෙඳ පොල මත පදනම් වූ භාණ්ඩාගාර පිළිණ පත් ඇති කිරීම සහ රජයේ සුරැකුම් පත් සඳහා වූ ද්විතීය වෙළෙඳපොල කටයුතුවල කාර්යක්ෂමතාව වැඩි කරලීම.

සහ රාජ්‍ය ණය කළමනාකරණය වැඩිදියුණු කිරීමවැනි ක්‍රියාමාර්ග ඇතුළත් විය යුතු ය.

සාර්ව ආර්ථික දර්ශක බොහොමයක හැසිරීම තරමක් දුරට සතුටුදායක විය. පසුගිය වසර පහ තුළ (1992-1996) දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය ඊට පෙර වසර පහ තුළ පැවතුන වර්ධන වේගය හා සසඳන කල වැඩි මට්ටමක පැවතුණි. 1996 හැරුණු කොට උද්ධමන අනුපාතය පහළ මට්ටමක පැවතුණි. අර්ධ වශයෙන් බාහිර සාධකවල බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස 1996 වසරේ දී ඉහළ උද්ධමනකාරී තත්ත්වයක් පැවැතීම නිසා මූර්ත පොලී අනුපාතිකවල තරමක පහත වැටීමක් දැකිය හැකි වුවත් එවා ධන අගයක් ගන්නා ලදී. 1980 ගණන්වල පැවැති ඉහළ රාජ්‍ය මූල්‍ය හිගය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10 ට අඩු ප්‍රමාණයක් දක්වා අඩුකර ගත හැකිවිය. මෙම ජයග්‍රහණයන් කෙසේ වෙතත් ප්‍රමාණවත් නොවේ. සමස්ත ආර්ථික ක්‍රියාකාරිත්වය නැගෙනහිර ආසියානු කලාපයේ සීඝ්‍ර ක්‍රියාකාරිත්වයකින් යුත් රටවලට වඩා අඩු මට්ටමක පවතී. රට තුළ ආර්ථික ස්ථායිකරණ උත්සාහයන් බොහෝවිට සඵල කර ගනු ලැබුවේ බලාපොරොත්තු වූ ප්‍රමාණයට වඩා මග හැරීම හා අඩුලුහුඬුකම් මධ්‍යයේ ය. අයවැය හිගයන් අඩු කිරීමේ තිරසාර මාවතකට ප්‍රවිෂ්ය වීමට නොහැකි වූ බව රටේ සාර්ව ආර්ථික දර්ශකයන් පෙන්නුම් කරනු ලබයි. ආරක්‍ෂක වියදම් ඉහළයාම සහ අතීතයේදී ජනප්‍රියත්වය පදනම් කරගත් ක්‍රියාමාර්ග නිසා අයවැය කළමනාකරණ සංකීර්ණතාවයකට පත් වී ඇත. සියයට 7-8 දක්වා දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයන් මධ්‍ය කාලීනව ලබා ගැනීමට සක්‍යතාවයක් තිබේ. කෙසේ වෙතත් මේ සඳහා ඉහත සඳහන් කළ ප්‍රධාන අංශවල ව්‍යුහගත ප්‍රතිසංස්කරණ කඩිනම් කිරීම සහ රාජ්‍ය මූල්‍ය ශක්තිමත් කිරීම සඳහා ඉහළ කැපවීමක් සමග ඉතා ප්‍රවේශමෙන් සැලසුම් කළ උපාය මාර්ග අවශ්‍ය වේ. උතුරු හා නැගෙනහිර පවතින ප්‍රශ්න හැකි ඉක්මනින් නිරාකරණය කිරීම මේ සඳහා අවශ්‍ය වන එක් හිතකර සාධකයක් වේ.